The Department of the

Registrar of Companies

Srilanka

eRoC
Towards the Business World

ANNUAL REPORT 2022

Performance Report and
Annual Accounts



කර්මාන්ත අමාත්‍යාංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

කාර්ය සාධන වාර්තාව - 2022

වැය ශීර්ෂය - 297

கைத்தொழில் அமைச்சு

கம்பனிகள் பதிவாளர் திணைக்களம்

செயலாற்றுகை அறிக்கை - 2022

செலவினத்தலைப்பு– 297

Ministry of Industrial

Department of the Registrar of Companies

Performance Report - 2022

Expenditure Head - 297

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර
1.3 අරමුණු හා ප්‍රධාන කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ විධායක හා මාණ්ඩලික නිලධාරී මණ්ඩලය
1.5 සංවිධාන සටහන
1.6 දෙපාර්තමේන්තුවේ ව්‍යුහය
1.7 සමාගම් අරමුදල

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ
2.2 අභියෝග
2.3 ඉදිරි ඉලක්ක

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්
3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය
3.7 මු.රෙ.208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක

පරිච්ඡේදය 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය
6.3 මානව සම්පත් සංවර්ධනය

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව

01. ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1815 දී ශ්‍රී ලංකා ආර්ථිකය ඉංග්‍රීසි පාලනයට නතුවීමත් සමඟම කෝපි, තේ හා රබර් වැනි ප්‍රධාන අපනයන බෝග වගාවන් ආරම්භ කරමින් ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය පුළුල් කිරීමට ඉංග්‍රීසීන් විසින් කටයුතු කර ඇත. ව්‍යාපාරික කටයුතු පහසු කරලීම සඳහා ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1861 දී සංයුක්ත ස්කන්ධ සමාගම් ආඥාපනතින් ආරම්භ කර ඇත. 1948 පෙබරවාරි 04 වැනිදා දක්වා පැවති ඉංග්‍රීසි පාලන කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ සමාගම් ලියාපදිංචිය 1897 සංයුක්ත ස්කන්ධ බද්ධ ආඥාපනත හා 1938 අංක 51 දරණ සමාගම් ආඥාපනත යටතේ සිදු කර ඇත. මෙම පනත යටතේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිහිටුවා, එම දෙපාර්තමේන්තුවට වෙළෙඳ ලකුණු ආඥාපනත, ව්‍යාපාර නාම ආඥාපනත, සීට්ටු ආඥාපනත හා සමිති ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීමද පවරා ඇත. 1979 අංක 02 දරණ ජාතික බුද්ධිමය දේපළ සංග්‍රහ පනතේ විධිවිධාන අනුව 1980 වර්ෂයේදී ජාතික බුද්ධිමය දේපළ දෙපාර්තමේන්තුවක් පිහිට වූ අතර එම දෙපාර්තමේන්තුවට 1981 වර්ෂයේදී වෙළෙඳ ලකුණු ආඥාපනත ක්‍රියාත්මක කිරීමේ වගකීම පවරා ඇත.

නිදහසින් පසුව ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික ක්ෂේත්‍රය දේශීය අනන්‍යතාවයකින් යුක්තව ක්‍රියාත්මක වූ අතරම එයට පහසුකම් සපයමින් 1982 අංක 17 දරණ සමාගම් පනත 1982 වර්ෂයේ සිට ක්‍රියාත්මක විය. මෙම පනත වසර 25 ක් පමණ ක්‍රියාත්මක වූ අතරම ශ්‍රී ලංකාවේ ආර්ථිකය පුළුල්වීමත්, ආයෝජකයින් විශාල ප්‍රමාණයක් ආකර්ෂණය කර ගැනීමට පහසුකම් ලබාදීමත් සැලකිල්ලට ගෙන එකී පනත තවදුරටත් සරල කරමින් 2007 අංක 07 දරණ සමාගම් පනත 2007 මැයි මස 03 වන දින සිට ක්‍රියාත්මක වේ.

තවද ලොව නන් දෙසින පැමිණෙන සේවාදායකයන්ට අංක 400, ඩී.ආර්. විජේවර්ධන මාවත, කොළඹ 10 ලිපිනයේ පවතින සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවටම පැමිණ ඉතා සංකීර්ණ ක්‍රියාවලියකට මුහුණ දී සේවා සපයා ගැනීමට සිදුවූ අතර මෙමගින් සේවාදායකයන්ගේ කාලය ශ්‍රමය මෙන්ම මුදල් නාස්ති වීම ද, බොහෝ ආයෝජකයන් අධෛර්යට පත් වීම ද සිදු විය.

මේ සඳහා විසඳුමක් ලෙස මාර්ගගත ක්‍රමයට සේවා සැපයීම කෙරෙහි අවධානය යොමු වූ අතර ඒ සඳහා වන eROC ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම පද්ධතියෙන් සේවා සැපයීමේ පළමු පියවර ලෙස 2018 වර්ෂයේ සමාගම් සංස්ථාපනය කිරීම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කිරීම ආරම්භ කරන ලද අතර මේ වන විට මෙම දෙපාර්තමේන්තුව දවසේ පැය විසි හතරම real-time live, eROC පද්ධතිය හරහා මාර්ගගත ක්‍රමයට සියලුම සේවාවන් සපයන රජයේ දෙපාර්තමේන්තුවකි.

1.2 ආයතනයේ දැක්ම හා මෙහෙවර

දැක්ම

ශ්‍රී ලංකාවේ ව්‍යාපාර අංශ ආවරණය කරමින් සංස්ථා යහපාලනය පිළිබඳව හැදියාවක් ක්‍රම ක්‍රමයෙන් බිහි කිරීමට සමත් සක්‍රීය නියාමන අධිකාරියක් ඇති කිරීම තුළින් විශ්වාසනීය ව්‍යාපාරික පසුබිමක් සංවර්ධනය කිරීම හා පෝෂණය කිරීම

මෙහෙවර

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව රජයේ ආර්ථික ප්‍රතිපත්තියට හා වෙළෙඳ ප්‍රතිපත්තියට අනුකූලතාවයක් ඇති වන සේ අදාළ පනත් යටතේ ව්‍යාපාර හා අනෙකුත් ආයතන සඳහා නීතිමය තත්ත්වයක් ලබා දීමට හා ඒවායේ කාර්යයන් ක්‍රමවත් කිරීමට පරිශ්‍රමයක් දරයි.



1.3 <u>අරමුණු හා ප්‍රධාන කාර්යයන්</u>

අරමුණු

- 2007 අංක 07 දරණ සමාගම් පනත
- සමිති ආඥාපනත - 123 වන අධිකාරිය
- 1935 අංක 61 දරණ සීට්ටු ආඥාපනත
- 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත

මගින් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති මූලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීම.

ප්‍රධාන කාර්යයන්

- පෞද්ගලික සමාගම්, පොදු සමාගම්, ඇපයෙන් සීමිත සමාගම්, සීමා රහිත සමාගම් , සහ ලැයිස්තුගත සමාගම් සංස්ථාපනය කිරීම.
- විදේශීය සමාගම් සහ අක්වෙරළ සමාගම්, සමිති, පොදු කොන්ත්‍රාත්, උකස්බැඳුම්කර, සෘණපත්‍ර, ගණන් පරීක්ෂකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම.
- සමාගම් පනත සහ සමිති ආඥා පනත අනුව සමාගම් සහ සමිති වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාල ලේඛන ලියාපදිංචි කිරීම.
- සමාගම් ඈවර කිරීම හා විසුරුවා හැරීම
- සමාගම්/සමිති වලට අදාල සියළුම තොරතුරු යාවත්කාලීන කිරීම
- සහතික පිටපත් නිකුත් කිරීම, මහජනතාව වෙත තොරතුරු ලබා දීම.
- ලේඛන තහවුරු කිරීම.
- ගාස්තු එකතු කිරීම හා සැසඳීම.
- රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වෙත අවශ්‍ය තොරතුරු, සහතික පිටපත් ලබා දීම හා අවශ්‍ය සහාය ලබා දීම



1.4 දෙපාර්තමේන්තුවේ විධායක හා මාණ්ඩලික නිලධාරී මණ්ඩලය

සංජීව දිසානායක මයා
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

පී.පී. ශ්‍යාමා හර්ෂණී මිය
සමාගම් රෙජිස්ට්‍රාර්

එල්.කේ.එස්.ධර්මකීර්ති මිය
සමාගම් රෙජිස්ට්‍රාර්

බී.ඒ.ආර්.එම්. බාලසූරිය මිය
ප්‍රධාන ගණකාධිකාරි

ජෙයවානි සුසාන්තකුමාර් මිය
ප්‍රධාන අභ්‍යන්තර විගනක

පී.එස්.ඩී.තරංග පණ්ඩිත සුන්දර මයා
නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර්

කේ.එච්.ශේන් ශ්‍රී නිලූෂ ද සිල්වා මයා
සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්

ආර්.ආර්.එස්.සී.රත්නායක මයා
සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්

එම්.ඩී.එච්.එස්.මතුගමගේ මයා
සහකාර සමාගම් රෙජිස්ට්‍රාර්/ නිලහාර ගැනුම්කරු (වැ.බ.)

ජී.එම්.එස්. පුෂ්පකුමාර මයා
සංඛ්‍යාලේඛනඥ

ඩබ්.එම්. ගයාන් කුමාර මයා
තොරතුරු තාක්ෂණ නිලධාරි

1.5 සංවිධාන සටහන



1. ICTO – Information & Communication Technology Officer
2. DO – Development Officer
3. CIO – Companies Inspector Officers
4. MSO –Management Service Officer
5. ICTA – Information & Communication Technology Assistant
6. OES – Office Employees Service

1.6 <u>දෙපාර්තමේන්තුවේ ව්‍යුහය.</u>

i. තොරතුරු සැපයීමේ අංශය

ii. සමාගම් නාම අනුමත කිරීමේ අංශය

iii. නව සමාගම් සංස්ථාපනය කිරීමේ අංශය

iv. සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ

v. සහතික පිටපත් නිකුත් කිරීමේ අංශය

vi. ඇවර කිරීමේ අංශය

vii. සම්මති ලියාපදිංචි කිරීමේ අංශය

viii. සමාගම් ලේකම්වරු සහ විගණකවරු ලියාපදිංචි කිරීමේ අංශය

ix. පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්) අංශය

x. ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව

xi. සමාගම් පරීක්ෂක අංශය

xii. ආයතන අංශය

xiii. ගිණුම් අංශය

xiv. අභ්‍යන්තර විගණන අංශය

xv. තැපැල් අංශය

xvi. තොරතුරු තාක්ෂණ අංශය සහ පාරිභෝගික සේවා අංශය

i. තොරතුරු සැපයීමේ අංශය

මහජන විමසීම් සඳහා කඩිනමින් පිළිතුරු සැපයීමට හැකියාව ඇති මනාව පුහුණුව ලැබූ සහ අත්දැකීම් සහිත නිලධාරියකු විසින් තොරතුරු සැපයීමේ අංශයේ සේවය සැපයීම සිදු කරනු ලබයි. දෙපාර්තමේන්තුව හා සම්බන්ධ වන මහජනයා වෙත අවශ්‍ය වන තොරතුරු ලබා දීම හා මගපෙන්වීම මෙම අංශයෙන් සිදුකරනු ලබන අතර එමඟින් මහජනතාවට දෙපාර්තමේන්තුවෙන් සේවාවන් සපයාගැනීම පහසු කරයි. එමෙන්ම සේවාලාභීන් විසින් භාර දෙන ලේඛන පරික්ෂාකර අදාල අංශ වෙත යොමු කිරීමත් මෙමගින් සිදු කරයි.

ii. සමාගම් නාම අනුමත කිරීමේ අංශය

සමාගමක් විසින් නමක් අයදුම් කිරීමට අයදුම්පතක් ඉදිරිපත් කළ පසු දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය පරික්ෂා කර බලා, එම නමට අනුමැතිය ලබා දීම සමාගම් පනතට හා නාමය අනුමත කිරීමේ රීතීන්ට අනුකූලදැයි වාර්තා කිරීම, මහජනතාවට, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවලට සමාගම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සහය වීමත්, සමාගම් වලට අදාළව ලියාපදිංචි අංකයන් ලබා දීම සහ යම් නමක් යටතේ සමාගමක් දැනටමත් සංස්ථාපනය කර ඇද්ද යන්න වාර්තා කිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

iii. නව සමාගම් සංස්ථාපනය කිරීමේ අංශය

සමාගම් සංස්ථාපනය කිරීමට අදාළව මාර්ගගත ක්‍රමය ඔස්සේ ලැබෙන අයදුම්පත් වල නිරවද්‍යතාවය පරික්ෂා කර බලා නිවැරදි ලේඛන ලියාපදිංචියට ඉදිරිපත් කිරීම සහ දෝෂ සහිත ලේඛන වල අඩුපාඩු කවරේදැයි අදාළ පාර්ශව වෙත දැන්වීම, සමාගම් සංස්ථාපනය සම්බන්ධයෙන් වන මහජනතාවගේ ගැටළු වලට විසඳුම් ලබා දීම, නිවැරදි කර එවන අයදුම්පත්‍ර පරීක්ෂා කර බලා නිවැරදි නම් ලියාපදිංචි කිරීමට කටයුතු කරනු ලබයි.

විස්තරය	භෞතික		
	2020	2021	2022
නාම අනුමත කිරීමට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව	18,412	26,534	25,352
අනුමත කළ සංඛ්‍යාව	17,653	26180	24,327
ක්‍රියාත්මක නොවූ අයදුම්පත් සංඛ්‍යාව	834	0	0
ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව	4	20	44



iv. <u>සමාගම් වල තොරතුරු යාවත්කාලීන කිරීමේ හා ලේඛන ලියාපදිංචි කිරීමේ අංශ</u>

සමාගම්වල තොරතුරු යාවත්කාලීන කිරීම හා ලේඛන ලියාපදිංචි කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වේ. එය A,B,C,D සහ E ලෙස අංශ 5ක් යටතේ සිදුකරනු ලබන අතර A සහ B අංශයන්ගෙන් ආකෘති අංක 15 ලේඛන සම්බන්ධයෙන් ද C අංශයෙන් ආකෘති අංක 20 ලේඛන සම්බන්ධයෙන් ද, D අංශය ආකෘති අංක 6,8 සහ 9 ලේඛන සම්බන්ධයෙන් ද E අංශය ආකෘති අංක 13,14,17,39 ලේඛන සම්බන්ධව සහ සමාගම් ඒකාබද්ධ කිරීම්, සමාගම් නාමය වෙනස් කරීම, ඇපයෙන් සීමිත සමාගම්, අක්වෙරළ සමාගම් සහ විදේශීය සමාගම් සම්බන්ධයෙන් ද කටයුතු කරයි.

v. <u>සහතික පිටපත් නිකුත් කිරීමේ අංශය</u>

සමාගම් වලට අදාලව සේවාදායකයන් විසින් ඉල්ලුම් කරනු ලබන ලේඛනයන්ගේ සහතික පිටපත් නිකුත් කිරීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි. මහජනතාවට කාර්යක්ෂම හා කඩිනම් සේවාවක් සැපයීම අරමුණු කරගෙන සමාගම්වලට අදාලව ලියාපදිංචි කරනු ලැබූ සියලු ලේඛනයන්ගේ සහතික පිටපත් මෙමගින් නිකුත් කරනු ලබයි.

vi. ඈවර කිරීමේ අංශය

මෙම අංශය මඟින් සමාගම්වල නාමය කපාහැරීම හා සමාගම් විසුරුවා හැරීම සම්බන්ධව පහත ආකාරයෙන් කටයුතු කරනු ලබයි.

01. 2007 අංක 07 දරණ සමාගම් පනතේ 394 වගන්තිය යටතේ නාමය කපා හැරීම.

- වත්කම් වගකීම් නොමැති සමාගම් වල නාමයන් කපා හැරීම.

මෙහිදී සමාගම් ඈවර කිරීමට සියළුම අධ්‍යක්ෂවරුන්ගේ හා අධ්‍යක්ෂ නොවන කොටස් හිමියන්ගේ දිවුරුම් ප්‍රකාශ හා ඉල්ලීම් ලිපියක් ලබාගන්නා අතර ඉන් පසු එම දිවුරුම් ප්‍රකාශ සඳහා නියෝග ලබා ගැනීමට ඉදිරිපත් කරනු ලබයි. ඉන්පසු සමාගම් 9 (සමාගමට) සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත විමසීම් ලිපි සකස් කරන අතර එම ලිපියේ දින සිට මසක් සහ දින 10ක කාලය තුල සමාගම් 10 සහ සමාගම් 04 ලිපි සකසනු ලබයි. දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ විරෝධතාවයක් නොමැත්තේ නම් භාෂාත්‍රයෙන් ගැසට් නිවේදනය නිකුත්කර එය ප්‍රකාශයට පත්වී මාස 03ක කාලයකින් අනතුරුව සමාගමේ නාමය කපා හැරීම සිදු කරනු ලබයි.
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් විරෝධතා දක්වන සමාගම් සම්බන්ධයෙන් අදාල සමාගම දැනුවත් කිරීමට කටයුතු කර එකී විරෝධතාවය අවසන් වන තුරු සමාගම ඈවර කිරීම වළවක්වනු ලැබේ.

- වාර්ෂික වාර්තා ගොනු කර නොමැති සමාගම් සම්බන්ධයෙන් එම සමාගම් දැනුවත් කිරීමෙන් අනතුරුව ඊට ප්‍රතිචාර නොදක්වන්නේ නම් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ විරෝධතාවයක් නොමැති නම් 2007 අංක 07 දරණ සමාගම් පනතේ 394 වගන්තිය යටතේ එකී සමාගම්වල නාමය කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

02. වත්කම් වගකීම් පවතින සමාගම් සම්බන්ධයෙන් ඈවරකරුවෙකු පත් කිරීමෙන්

- සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන්
- ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන්
- අධිකරණ නියෝගයකින්

යන තුන් ආකාරයෙන් එක් ආකාරයකට සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි. මෙහිදී ගොනු කරන ලේඛන ලියාපදිංචි කරන අතර අවසන් ලේඛනය ලියාපදිංචි කර මාස 03කින් පසු සමාගම විසුරුවා හැරීම සිදු කරනු ලබයි. අධිකරණ නියෝගයකින් ගණන් බෙරා විසුරුවා හරින විට අවසන් අධිකරණ නියෝගය ලියාපදිංචි කිරීමෙන් පසු විසුරුවා හැරීම සිදු කරනු ලබයි.

03. සමාගම් ඒකාබද්ධ කිරීමෙන් පසු එම සමාගම් වල නාමයන් කපා හැරීමට කටයුතු කිරීම.

04. සමාගම් වල නාමයන් කපා හැරීම පරීක්ෂා කිරීමට දෛනිකව පැමිණෙන සේවාදායකයන්ගේ ඉල්ලීම්වලට අදාළ ලේඛන නිකුත් කිරීම.

05. මාර්ගගත ක්‍රමය ඔස්සේ ද මේ වන විට නාමය කපා හැරීමේ කටයුතු සිදු කරනු ලබයි.

06. තවද නාමය කපා හැරීමට දිවුරුම් ප්‍රකාශ ලබා දුන්නද ඉන් පසුව සමාගම පවත්වා ගෙන යාමට අවශ්‍ය සමාගම් වලින් දිවුරුම් ප්‍රකාශ ලබාගෙන නාමය කපා හැරීමේ නියෝග අවලංගු කිරීමට කටයුතු කිරීම.

විසුරුවා හැර ඇති සහ අවලංගු කර ඇති සමාගම් සංඛ්‍යාව (2022.12.31 දක්වා)

	2019	2020	2021	2022
සාමාජිකයින් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම	43	21	09	27
ණයහිමියන් ස්වේච්ඡාවෙන් ඈවර කිරීම	09	05	06	05
අධිකරණයෙන් ඈවර කිරීම	06	01	03	04
පනතේ 394 යටතේ නම කපා හැරීම	381	210	209	212
ඒකාබද්ධ කිරීම හේතුවෙන් නම කපා හැරීම	46	29	15	4
විදේශ සමාගම්වල නාමය කපා හැරීම	0	0	13	13
එකතුව	485	266	255	265



vii. <u>සමිති ලියාපදිංචි කිරීමේ අංශය</u>

සමිති ආඥා පනතේ 123 වන අධිකාරිය යටතේ නිලධාරීන් 08 වඩා වැඩි සමිති හා සංගම් ලියාපදිංචි කිරීම සිදු කළහැකිය. සහ පවත්වාගෙන යාම නියාමනය කිරීම මෙම අංශය මගින් සිදු කරයි. 2022.12.31 දින වන විට ලියාපදිංචි කර ඇති මුළු සමිති සංඛ්‍යාව 16,196ක් වේ.

සමිති වර්ගය	2016	2017	2018	2019	2020	2021	2022
විහාරස්ථාන	21	16	18	06	01	-	-
සර්වෝදය	-	-	-	-	-	-	-
මිතුරු සංවර්ධන	83	48	09	-	-	-	-
ඉසුරු සංවර්ධන	-	-	-	-	-	-	-
කාන්තා සමිති	-	-	-	-	-	-	-
ග්‍රාමීය සංවර්ධන	-	-	-	-	-	-	-
ග්‍රාමශක්ති	-	-	1037	2431	98	01	-
ජල	-	-	-	-	09	01	-
වෙනත් (සුභසාධක)	21	15	22	18	32	29	22
ලියාපදිංචි වීමට ඇති	-	-	-	-	-	01	-
එකතුව	**125**	**79**	**1086**	**2455**	**140**	**32**	**22**



viii. <u>සමාගම් ලේකම්වරු සහ විගණකවරු(ගණන් පරීක්ෂකවරු) ලියාපදිංචි කිරීමේ අංශය</u>

1987 සමාගම් ලේකම්වරයන් පිළිබඳ නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් සමාගම් ලේකම්වරයෙකු ලෙස ලියාපදිංචි කිරීම සහ 1964 සමාගම් ගණන් පරීක්ෂක නියෝග යටතේ අදාළ සුදුසුකම් සපුරා ඉල්ලුම් කරන අයදුම්කරුවන් ගණන් පරීක්ෂක ලෙස ලියාපදිංචි කිරීම මෙම අංශය මඟින් සිදු කරනු ලබයි. 2022.12.31 දිනට සමාගම් ලේකම්වරු 1026 දෙනකු හා ගණන් පරීක්ෂකවරු 388 දෙනකු ලියාපදිංචි කිරීම සිදු කර ඇත.

<u>විගණකවරුන් සහ සමාගම් ලේකම්වරුන් ලියාපදිංචි කිරීම</u>

වර්ෂය	විගණකවරු	සමාගම් ලේකම්වරු
2016	29	680
2017	26	817
2018	20	815
2019	11	264
2020	315	641
2021	359	779
2022	388	1026



ix. <u>පොදු කොන්ත්‍රාත් (ටෙන්ඩර්)අංශය</u>

1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යටතේ රුපියල් මිලියන 05 ට වැඩි කොන්ත්‍රාත් සඳහා ලැබෙන අයදුම්පත් පරීක්ෂා කොට ටෙන්ඩර්කරුවෙකු වෙනුවෙන් හෝ අනුනියෝජිතයෙකු, උප අනු නියෝජිතයෙකු, නියෝජිතයෙකු හෝ නාමිකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම සහ පොදු කොන්ත්‍රාත් ගිවිසුම් පනත යටතේ කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම, අළුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

වර්ෂය	ප්‍රමාණය	ආදායම(රු.)
2016	17875	29,949,500.00
2017	19275	31,174,500.00
2018	24743	39,502,500.00
2019	23962	41,895,000.00
2020	19233	44,608,336.00
2021	22445	50,344,000.00
2022	13216	29,066,000.00

<u>පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම</u>



<u>වාර්ෂික පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි ආදායම (රු.)</u>



x. ලේඛනාගාරය සහ විමර්ශන ශාලාව

සමාගම් සහ සමිතිවලට අදාල භෞතික ගොනු සුරක්ෂිතව තබා ගැනීමත් අවශ්‍ය අවස්ථාවන්හිදී නිලධාරීන් වෙත සහ සුපරීක්ෂණය යටතේ මහජනතාවට පරීක්ෂාකර බැලීමට නිකුත් කිරීමත්, නැවත නිසිපරිදි එම ගොනු භාර ගැනීමත් ලේඛනාගාරය මගින් සිදු කරයි. ගාස්තු ගෙවීමෙන් පසු දෙපාර්තමේන්තු අධීක්ෂණය යටතේ, සමාගම් ගොනු හා සමිති ගොනු භෞතිකව පරීක්ෂා කර බැලීම සඳහා මහජනතාවට විමර්ශන ශාලාව තුළ ඉඩකඩ සලසා ඇත. දෛනිකව ලේඛනාගාරය තුළ ඇති ගොනු සංඛ්‍යාවද ක්‍රමයෙන් වර්ධනය වන බැවින් දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලිය පරිගණකගත කිරීමේ අවශ්‍යතාවය ලේඛනාගාරයට සුවිශේෂී වේ.

xi. සමාගම් පරීක්ෂක අංශය

මෙම අංශයේ කාර්යයන් සඳහා සමාගම් පරීක්ෂක නිලධාරීන් අනුයුක්ත කර ඇති අතර එම අංශයේ කාර්යයන් පහත පරිදි වේ.

- සමාගම් පනතට පටහැනිව කටයුතු කරන සමාගම්වලට හා අධ්‍යක්ෂවරුන්ට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ නියෝග මත නඩු පැවරීම සහ එසේ පවරන නඩු වලට සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් අධිකරණයේ පෙනී සිටීම
- අධිකරණයේ පැවැත්වෙන නඩු කටයුතුවලදී සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවෙන් නියෝජිතයකු ලෙස පෙනී සිටීම
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝග මත සමාගම් වෙත ගොස් ලේඛන පරීක්ෂා කිරීම හා ස්ථානීය පරීක්ෂාවන් සිදු කිරීම
- සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නියෝග මත වෙනත් රජයේ ආයතන වෙත හා විමර්ශනයන් සඳහා අවශ්‍ය ලේඛන ලබාදීම ප්‍රකාශ ලබා දීම හා සහයවීම

xii. ආයතන අංශය

දෙපාර්තමේන්තුවේ පරිපාලනමය කටයුතු ක්‍රමවත්ව සහ නිසි පරිදි කරගෙන යාම මෙම අංශය මගින් සිදු කරන අතර එහි අධීක්ෂණ කටයුතු නියෝජ්‍ය සමාගම් රෙජිස්ට්‍රාර් විසින් සිදු කරයි.

xiii. ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මූල්‍ය කටයුතු හා ගිණුම් පවත්වාගෙන යාම මෙම අංශය මගින් සිදුකරනු ලබන අතර එය ප්‍රධාන ගණකාධිකාරිගේ අධීක්ෂණය යටතේ සිදුකරනු ලබයි.

xiv. අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර පාලන ක්‍රම විධිමත් කර ගැනීමට අදාළව විගණන කටයුතු කරගෙන යාම සඳහා 2016 වර්ෂයේදී දෙපාර්තමේන්තුව තුළ මෙම අංශය ස්ථාපිත කර ඇති අතර පළමුවන ශ්‍රේණියේ ගණකාධිකාරීවරයෙකුගේ අධීක්ෂණය යටතේ එහි කටයුතු සිදුකරනු ලබයි.

xv. තැපැල් අංශය

දෙපාර්තමේන්තුවට ලැබෙන ලිපි ලේඛන භාර ගැනීම අදාල අංශ වෙත යොමු කිරීම සහ දෙපාර්තමේන්තුවෙන් පිටතට යවනු ලබන ලිපි ලේඛන සම්බන්ධයෙන් කටයුතු කිරීම මෙම අංශයෙන් සිදු කරනු ලබයි.

xvi. තොරතුරු තාක්ෂණ අංශය සහ පාරිභෝගික සේවා අංශය

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ අතර සුවිශේෂී කාර්ය භාරයක් ඉටු කරන එක් ප්‍රමුඛ අංශයක් වශයෙන් තොරතුරු තාක්ෂණ අංශය හඳුන්වා දීමට හැකිය.

මෙම අංශයේ කාර්ය භාරය ඉතා පුළුල් වශයෙන් ප්‍රසාරණය වීම ආරම්භ වූයේ දෙපාර්තමේන්තුවෙන් ඉටුවන මුඛ්‍ය අරමුණ වන මුළු දිවයිනම ආවරණය වන පරිදි සමාගම් ලියාපදිංචි කිරීමේ මෙතෙක් පැවති ලිපිගොනු මූලික වූ ශ්‍රමික ක්‍රියාවලිය (Manual Process) වෙනුවට මාර්ගගත කළ පරිගණක ක්‍රියාවලිය හෙවත් “e RoC Online Process” හඳුන්වා දීමත් සමඟය. මෙම සුවිශේෂී ක්‍රියාවලිය මුල්වරට හඳුන්වා දෙනු ලැබුවේ 2018 වර්ෂයේ අප්‍රේල් මස සිටය. මෙම ක්‍රියාවලිය හඳුන්වා දීමත් සමඟ මෙතෙක් පැවති ක්‍රමවේදය තුළ දී දක්නට ලැබුණු ප්‍රායෝගික දුර්වලතාවයන් හඳුනා ගැනීමටත් ඒවාට කඩිනම් විසඳුම් ලබා දීමටත් මෙම සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය ඉතා කෙටි කාලයක් තුළ දී කාර්යක්ෂමව මෙන්ම ඵලදායී ලෙස පාරිභෝගිකයින් මූලික කරගත් (Client Oriented) ක්‍රියාවලියක් බවට පත් කිරීමටත් තොරතුරු තාක්ෂණ අංශය මඟින් විවිධ පියවරයන් ගන්නා ලදී. එසේ ගනු ලැබූ පියවරයන් අතර සුවිශේෂී ඒවා කිහිපයක් පහත පරිදි දැක්විය හැකිය.

- පරිශීලක මිත්‍රශීලි (User Friendly) ක්‍රියාවලියක් හඳුන්වා දීම.
- සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සඳහා ගත වන කාලය හැකි පමණ අවම කිරීම.
- අදාළ ගාස්තු ගෙවීම් අන්තර්ජාලය හරහා ම ඉටු කිරීමේ පහසුකම් ලබා දීම.
- මෙතෙක් තමන් විසින් ම සකස් කළ අයදුම්පත් වෙනුවට පරිගණකය වෙත තමන් විසින් ඇතුළත් කරන දත්ත උපයෝගි කර ගනිමින් ස්වයංක්‍රීයව ම (System Generated Applications) අයදුම්පත් සහ ඒ ඒ අදාළ ආකෘති පත්‍ර සකස් කර ගැනීමට හැකි වීම.

- පාරිභෝගිකයින් හට තමන් විසින් ලියාපදිංචි කළ ආයතන පිළිබඳ තොරතුරු තමන්ට අවශ්‍ය අවස්ථා වලදී තමන්ගේ පරිශීලක තොරතුරු (User Login Details) උපයෝගී කර ගනිමින් අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී ඕනෑම ස්ථානයක දී පරිගණකය භාවිතා කර ලබා ගත හැකි වේ.
- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කටයුතු සඳහා පැමිණෙන පාරිභෝගිකයින් සඳහා පරිගණක භාවිතා කිරීමේ පහසුකම් තොරතුරු තාක්ෂණ අංශය තුල දී සලසා දී ඇත.
- අවශ්‍ය අවස්ථාවලදී e RoC Online Process පිළිබඳව තොරතුරු සහ උපදෙස් ලබා දීමට කටයුතු ක්‍රියාත්මක කර දී ඇත.
- පාරිභෝගිකයින් වෙත අවශ්‍ය අවස්ථා වලදී තාක්ෂණික උපදෙස් ලබා දීමටත් මෙම අංශය මඟින් කටයුතු යොදා ඇත.
- පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩමුළු වරින්වර පැවැත්වෙනු ඇත.

  කෙසේ නමුත් මෙම දෙපාර්තමේන්තුවට අනුමත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂ තනතුර, සහකාර අධ්‍යක්ෂ තනතුරු 02ක් , තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි තනතුරු 03ක් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරු 04ක් පුරප්පාඩුවී පැවතීම හේතුවෙන් e RoC Online Process (මාර්ගගත ක්‍රියාවලිය) සාර්ථකව අඛන්ඩව පවත්වාගෙන යාම දැඩි අභියෝගයක් වී ඇත.

1.7 <u>සමාගම් අරමුදල</u>

2007 අංක දරණ සමාගම් පනතේ 479 වැනි වගන්තිය යටතේ සමාගම් අරමුදල පිහිටුවා ඇත. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ එකඟත්වය මත, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නියම කරනු ලබන ආකාරයට මෙම අරමුදල පවත්වා ගෙන යනු ලැබේ. සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් මෙම පනත යටතේ නියම කරනු ලබන, පනවනු ලබන හෝ අය කරනු ලබන සෑම ගාස්තුවකින්ම හෝ අයකිරීමකින්ම තුනෙන් දෙකොටසක් (2/3) සමාගම් අරමුදලට ගෙවනු ලැබිය යුතුය. මෙම පනත යටතේ තම බලතල ක්‍රියාත්මක කිරීමේදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකඟතාවය මත සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් විසින් දරනු ලබන යම් වියදමක් පියවීම සඳහා නියමිත සියළු මුදල් මෙකී අරමුදලින් ගෙවිය හැකිය.

02. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 විශේෂ ජයග්‍රහණ

❖ **සමාගමක් සංස්ථාපනය කිරීමේ සිට සමාගමක් වසා දැමීම දක්වා සියලුම කාර්යයන් 100% ම මාර්ගගත ක්‍රමය මඟින් සිදු කිරීම**

සමාගමක නාමය අනුමත කිරීමේ සිට සමාගම සංස්ථාපනය කිරීම දක්වාද සමාගමක සිදුවන වෙනස්වීම් යාවත්කාලීන කිරීමේ සිට සමාගමක නාමය කපා හැරීම හා ඇවර කිරීම දක්වා ද සියලුම සේවාවන් සැපයීම 100%ක්ම මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදුකරනු ලැබීම සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව ලැබූ ජයග්‍රහණයකි. මෙහිදී සමාගමක නාමය අනුමත කිරීමට ඉල්ලීමක් ලැබුණු විට පද්ධතිය මඟින් එය පරීක්ෂාකර එසැණින් අනුමත කිරීමේ පණිවිඩය අයදුම්කරුගේ පරිගණකය වෙත ලබා දේ. එවිට එසැණින් අයදුම්කරුට සමාගම සංස්ථාගත කිරීමට අදාල ලේඛන සකස් කිරීම, දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ගාස්තු ගෙවීම දෙපාර්තමේන්තුවට අදාල ලේඛන ගොනු කිරීම යන කටයුතු ලෝකයේ ඕනෑම ස්ථානයක සිට ඕනෑම වේලාවකදී තම පරිගණකය ඔස්සේ සිදු කිරීමට හැකිවන පරිදි පද්ධතිය යාවත්කාලීන කර ඇත. තවද සමාගම සංස්ථාපනය කිරීමේ සහතිකය අයදුම්කරුට පරිගණකය ඔස්සේ ලබාදෙන අතර එම සහතිකය QR කේතයක් සහිතව නිකුත් කරන බැවින් ඕනෑම අයෙකුට එකී QR කේතය හරහා සහතිකයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමේ හැකියාව පවතින බැවින් ලේඛනවල වලංගුතාවය ඉහළ මට්ටමකට ගෙනැවිත් ඇත. සමාගම්වල සිදුවන වෙනස්කම් වලට අදාල ලේඛන ඉදිරිපත් කර සමාගම්වල තොරතුරු යාවත්කාලීන කිරීමට අදාල සියලු සේවාවන්ද online ක්‍රමවේදය ඔස්සේ සිදුකිරීමට මහජනතාවට පහසුකම් ලබා දී ඇත.

❖ **සමාගම් ගොනු මාර්ගගත ක්‍රමයට පරිශීලනය කිරීමට (e-Search) පහසුකම් සැලසීම**

සම්ප්‍රදායික ක්‍රමයට මහජනතාවට යම් සමාගම් ගොනුවක් පරිශීලනය කිරීමට අවශ්‍ය වුවහොත් ඒ සඳහා රාජකාරි දිනයක රාජකාරි වේලාව තුළ දෙපාර්තමේන්තුවට පැමිණ තම අවශ්‍යතාවය ඉටුකර ගැනීමට සිදුවිය. නමුත් මෙම වර්ෂයේ e-Search හඳුන්වා දීමත් සමග සේවාදායකයන්ට තමා සිටින ස්ථානයේ සිට තමන්ට අවශ්‍ය සමාගම් ගොනු පරීක්ෂා කිරීමේ හැකියාව ඇත.

❖ E Certificate with Verification

ලොව බොහෝ රටවල් ආදර්ශයට ගන්නා සිංගප්පූරුව හා නවසීලන්තය වැනි ඉතා දියුණු රටවල සමාගම් ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියේදී පවා දැකිය නොහැකි මාර්ගගත සත්‍යාපනය කිරීමක් ද (online verification) සහිතව සංස්ථාපන සහතිකය මාර්ගගත ක්‍රමයට නිකුත් කිරීම ආරම්භ කිරීම ද මෙම වසරේදී සිදු කරන ලදී. ලොව නන්දෙසින් සමාගම් ලියාපදිංචි කරන්නන් මෙම දෙපාර්තමේන්තුවට පැමිණ සංස්ථාපන සහතිකය ලබා ගැනීමට තිබූ අවශ්‍යතාවය මෙම සේවාව සමග සාර්ථකව ඉවත් කිරීමට හැකිවූ අතර මෙමගින් ව්‍යාපාරික ජනතාවට මෙන්ම සමාගම් පිළිබඳ සැලකිලිමත් වන තුන්වන පාර්ශවයන්ටද වඩාත් පහසු මෙන්ම ආරක්ෂාකාරී වාතාවරණයක් නිර්මාණය වී ඇත.

❖ මාර්ගගත ක්‍රමයට සහතික පිටපත් ලබා දීම

පෙර පැවති ක්‍රමය යටතේ සහතික පිටපත් ලබා ගැනීම ඉතා සංකීර්ණ හා දිගු කාලයක් ගතවන ක්‍රියාවලියක් බැවින්ද තම කාලය හා මුදල් කැප කර කිහිප වරක් දෙපාර්තමේන්තුව වෙත පැමිණීමට සිදුවන බැවින් මහජනතාවගේ නොසතුටට හේතු විය. තවද covid පැතිරීම හා ප්‍රවාහන අපහසුතා නිසා මහජනතාවට සේවාවන් වෙත ලඟාවීම දුෂ්කර වීම හේතුවෙන් මෙම තත්ත්වය වඩාත් උග්‍ර විය. මෙයට විසඳුමක් වශයෙන් e certified copies සේවාව හඳුන්වා දීමට හැකිවීම අප ලැබූ විශාල ජයග්‍රහණයකි. මෙම සේවාව යටතේ මහජනතාවට තමන්ට අවශ්‍ය සහතික පිටපත් තමා සිටින ස්ථානයේ සිටම මාර්ගගත ක්‍රමයට ලබාගත හැක. මෙම සේවාව දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ මැදිහත් වීමකින් තොරව පැය විසිහතරම සේවා සපයන Online Real-time Certified Copies Issuing Service තත්වයට දියුණු කර ඇත.

❖ DOC Verification (මාර්ගගත ක්‍රමයට ලේඛන සත්‍යාපනය කිරීම)

ලියාපදිංචි ලේඛන වල සහතික කළ පිටපත් සඳහා වන අයදුම්පතක් අනුමත වූ විට, එකී ලේඛන සත්‍යාපනය කිරීම සඳහා QR කේත (QR Code) සහ සබැඳි (URL) අඩංගු ලේඛනයක් විද්‍යුත් තැපෑලෙන් (email) ඉල්ලුම්කරු වෙත යොමු කරනු ලබන අතර එහි සඳහන් සබැඳි (URL) වෙත පිවිසීම තුලින්, පරිශීලකයාට අවශ්‍ය ලේඛන වෙත ප්‍රවේශ වීමට සහ/හෝ මුද්‍රණ පිටපත් ලබා ගැනීමට අවකාශය ලබා දී ඇත.

සියලුම අයදුම් කරන ලද සහතික කළ පිටපත් සඳහා QR කේතය (QR Code) බැඟින් නිකුත් කරන අතර ලේඛනය ක්ෂණිකව පරීක්ෂා කිරීම සඳහා QR කේතය (QR Code) පරිලෝකනය (scanning) කිරීමෙන් හෝ සබැඳිය (URL) වෙත පිවිසීමෙන් සිදු කල හැකිවේ.

ඒ අනුව සහතික පිටපත ඉල්ලා සිටින ආයතනය වෙත ඉදිරිපත් කරනු ලබන ලේඛනයේ ඇති QR කේතය (QR Code) හෝ සබැඳිය (URL) වෙත පිවිසීමෙන් එකී ලේඛනය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති ලේඛනයේ සහතික පිටපතක්ද යන වග තහවුරු කර ගත හැක. තවද බාගත කරන ලද ලේඛනයේ මුද්‍රණය කරන ලද සංකේත අංකය (Access Point) https://docverify.drc.gov.lk යන වෙබ් පිටුව වෙත පිවිසීමෙන්ද ලේඛන වල සත්‍යතාවය තවදුරටත් තහවුරු කර ගත හැක, මෙසේ නිකුත් කරනු ලබන සත්‍යාපන ලේඛනයක් දෙපාර්තමේන්තුවෙන් අනුමත කල දින සිට මාස 3ක් සඳහා වලංගු වේ.

❖ රාජ්‍ය ආයතන වෙනුවෙන් Online File Search ක්‍රමවේදයක් හඳුන්වා දීම

රජයේ ආයතන වෙනුවෙන් මුදල් ගෙවීමකින් තොරව තමන් අභිමත ඕනෑම මොහොතක දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති සමාගම්වලට අදාල ලේඛන මාර්ගගත ක්‍රමයට එසැණින් පරීශීලනය කිරීමට අවස්ථාව ලබා දී ඇත.

❖ පාරිභෝගික සේවා අංශය ස්ථාපිත කිරීම

දෙපාර්තමේන්තු දත්ත පද්ධතිය භාවිතා කරන්නන් හට එකී පද්ධතිය භාවිතා කිරීමේදී ඇතිවන ගැටළු ඉදිරිපත් කිරීමටත් උපදෙස් හා සහාය ලබා ගැනීම සඳහාම වෙන්වූ අංශයක් ස්ථාපිත කරන ලෙස ඉල්ලීම් පැවතිණ. දෙපාර්තමේන්තුව තුළ පවතින හිඟ කාර්යමණ්ඩලය යටතේ වුවද ඒ සඳහා වෙනම අංශයක් පිහිටුවා කාර්ය මණ්ඩලය යොදවා එම ගැටළු සඳහා පිළියම් ලබා දීමට හැකිවීම අප දෙපාර්තමේන්තුව ලැබූ ජයග්‍රහණයකි.

❖ කඩදාසි භාවිතය අවම කිරීමට හැකි වීම

සමාගම් සංස්ථාපනකිරීමේදී, සමාගමක නාමය වෙනස් කිරීමේදී, සමාගම් ඒකාබද්ධ කිරීමේදී, සෘණභාර ලියාපදිංචි කිරීමේදී, පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේදී, සමාගම් ලේකම්වරු සහ විගණකවරු ලියාපදිංචි කිරීමේදී සහ සමිති ලියාපදිංචි කිරීමේදී නිකුත් කළ යුතු සහතිකය සඳහා අවශ්‍ය කඩදාසි මිලදීගෙන එය රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කර ගන්නා ලදී. මීට අමතරව සේවාදායකයන් විසින් සේවා ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතු අයදුම්පත් රජයේ මුද්‍රණාලයෙන් මුද්‍රණය කර ලබා ගන්නා ලදී. මේ සඳහා විශාල වියදමක් දැරීමට සිදු වූ අතර දෙපාර්තමේන්තු කටයුතු මාර්ගගත ක්‍රමයට සිදු කිරීමත් සමග නිකුත් කරනු ලබන සියලුම සහතික පිටපත් මුද්‍රණය කිරීම නතර කර, මාර්ගගත ක්‍රමයට එකී පිටපත් නිකුත් කිරීම මගින් මෙම වියදම් අඩු කිරීමට හැකියාව ලැබීම අපගේ විශාල ජයග්‍රහණයකි.

මීට අමතරව සහතික පිටපත් ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛතම කාර්යයක් වන අතර ඒ සඳහා කඩදාසි විශාල ප්‍රමාණයක් භාවිතා වූ අතර මෙම වසරේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් නවතා දමන ලද අතර ඡායා පිටපත්කිරීමේ කටයුත්ත ද නතර කිරීම හේතුවෙන් ඒ සඳහා දරන ලද වියදම ද අඩු කිරීමට හැකි විය.
කඩදාසි භිගයක් පවතින සහ දැඩි ආර්ථික අර්බුදයක් පවතින වර්තමානයේ කඩදාසි භාවිතය අවම කර ඒ සඳහා දැරීමට සිදුවන වියදම් අවම කිරීමට හැකිවීම රජයේ ආයතනයක් ලෙස අප ලැබූ සුවිශේෂ ජයග්‍රහණයකි.

2.2 <u>අභියෝග</u>

- e–RoC ව්‍යාපෘතිය අඛණ්ඩව යාවත්කාලීන කරමින් පවත්වාගත යුතුය. එහිදී අවශ්‍ය වන උපාංග හා සේවාවන් කඩිනමින් හා ඉහළ ප්‍රමිතියකින් යුක්තව ලබාගත යුතු අතර ඒවා ඉහළ වෙළඳපොළ වටිනාකමකින් යුක්තය. e–RoC පද්ධතිය ප්‍රශස්ථ ලෙස පවත්වා ගැනීමට අවශ්‍ය සේවාවන් ලබා ගැනීමේදී හා එය නඩත්තු කිරීමේදී එකී වියදම් දැරිය යුතු වන්නේ ද රජයේ නියමිත රෙගුලාසි හා නියමයන් අනුවය. එසේ රජයේ රෙගුලාසි හා නියමයන් අනුව කටයුතු කිරීමේදී වියදම් සීමාකිරීම් සහ ක්‍රියා කිරීමට නොවැලැක්විය හැකි යම් කාලයක් ගත වීම හේතුවෙන් ක්ෂණිකව ප්‍රතිචාර දැක්විය යුතු හා මිල අධික ඉහළ ප්‍රමිතියෙන් යුතු සේවා අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම දැවැන්ත අභියෝගයකි.

- e–RoC පද්ධතිය යටතේ මාර්ගගත ක්‍රමය මගින් සම්පූර්ණයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන සේවා සැපයීම සිදු වන බැවින් එම ක්‍රියාවලිය නියාමනය කිරීම සහ යාවත්කාලීනව පවත්වාගෙන යාම සඳහා තොරතුරු තාක්ෂණ අංශයක් පිහිටුවා ඇත. එම අංශය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරුන් දෙදෙනකු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් 03දෙනෙකු හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරුන් 06 දෙනෙකු සහිත කාර්ය මණ්ඩලයක් අනුමත වී ඇත. නමුත් පරිගනක පද්ධතියක් මගින් සියලුම සේවා සපයන මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන්නේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 02ක් පමණක් වන අතර එම අංශයේ ඉතිරි සියලු තනතුරු පුරප්පාඩු වී පවතී. එබැවින් දෙපාර්තමේන්තුවට නිරන්තරයෙන් අවශ්‍ය වන තොරතුරු තාක්ෂණ සේවා සඳහා උපදෙස් ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා කොන්ත්‍රාත්තුව ලබාගත් ආයතනය මත සම්පූර්ණයෙන් යැපීමට සිදුවී ඇති අතර එය දෙපාර්තමේන්තුවට ස්වාධීනව කටයුතු කිරීමට අභියෝගයක් වී ඇත.

- e–RoC පද්ධතිය තාක්ෂණික වශයෙන් ඉතා ඉහළ මට්ටමක පවතින හා සංකීර්ණ ක්‍රියාවලියක් සිදු කෙරෙන පද්ධතියක් බැවින් එම පද්ධතිය සම්බන්ධව කටයුතු කිරීම සඳහා විශේෂඥ දැනුම ඇති නිලධාරීන්ගේ සේවය අත්‍යාවශ්‍ය වේ. මේ සඳහා තොරතුරු තාක්ෂණ/ දත්ත පද්ධති පරිපාලක (Data Base Administrator) සහ මෘදුකාංග සංවර්ධනය පිළිබඳ දැනුම ඇති නිලධාරීන්ගේ (Software Developers) සේවය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වන නමුත් එවැනි තනතුරු රාජ්‍ය සේවය තුළ නොමැත. රජයේ දැනට පවතින තනතුරු වල නිලධාරීන් මෙම පද්ධතිය ඉදිරියට ගෙන යාමට තරම් යාවත්කාලීන වූවන්ද යන්න ගැටළුවකි.

- e–RoC පද්ධතිය සංවර්ධනය කිරීමට සමගාමීව වැඩිදියුණු කළ server room නොමැතිවීම හා එය යථා පරිදි නඩත්තු කර පවත්වාගෙන යාමට ප්‍රමාණවත් තාක්ෂණික දැනුම ඇති නිලධාරීන් නොමැති වීම තවත් ගැටළුවකි.

- තාක්ෂණයට අනුගත වීමට අකමැති පිරිසක් සිටීම ද ඔවුන්ගේ සෘණාත්මක අදහස් හා ක්‍රියාවන් සමග සාර්ථකව ඉදිරියට යාම ද අප ඉදිරියේ ඇති අභියෝගයකි.

- e–RoC පද්ධතිය සමග අනෙකුත් රාජ්‍ය ආයතන ඒකාබද්ධ කිරීම රජයේ ප්‍රතිපත්තිය වුවද එම ආයතන මෙම පද්ධතිය හා සම්බන්ධ වීමට හැකි මට්ටමට තවම සංවර්ධනය වී නොතිබීම හා යම් ආයතන ඒ සඳහා දක්වන අකමැත්ත නිසා ඒකාබද්ධ වීම අපහසු වී ඇත.

- තවද අනුමත නිලධාරීන් 163ක් සහිත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් තනතුරු 49ක් පුරප්පාඩු වී පවති. එනම් කාර්ය මණ්ඩලයෙන් තුනෙන් එකකට ආසන්න තනතුරු ප්‍රමාණයක් පුරප්පාඩුවී පැවතීම හේතුවෙන් දෙපාර්තමේන්තු කාර්ය කළමණාකරණය කිරීම අපහසු වී ඇත. මීට අමතරව 2022.12.31 දිනට තවත් නිලධාරීන් 03ක් වසර 5ක් සඳහා දේශීය/විදේශීය වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇත.

2.3 ඉදිරි ඉලක්කයන්

- **Electronic Signature** හඳුන්වා දීම

  දැනට පවතින ක්‍රමය අනුව සේවාදායකයන් අදාල තොරතුර පද්ධතියට ඇතුලත් කර එහි දෘඩ පිටපතක් ලබාගෙන එය අත්සන් කර scan කර නැවත පද්ධතියට උඩුගත කළ යුතුය. මෙය පියවර කීපයක් සහිත ක්‍රියාවලියක් බැවින් සේවාදායකයාගේ කාලය හා මුදල් වැය කරයි. එබැවින් අප ඉදිරි වසර තුළදී **Electronic Signature** ක්‍රමය හඳුන්වා දීමට අපේක්ෂා කරන අතර එමගින් සේවාදායකයන්ට ලේඛන බාගත කිරීමකින් තොරව අදාල මෘදුකාංගය භාවිතා කර පරිගණකය හරහාම අත්සන යොදා දෙපාර්තමේන්තුවේ පද්ධතිය වෙත එවිය හැකි වේ. මෙමගින් සේවාදාකයන්ට අපගේ සේවාවන් ලබා ගැනීම තවත් සරල හා පහසු වනු ඇත.

- **Simplification of Incorporation Process**

  සමාගමක් සංස්ථාගත කිරීමට දැනට ආකෘති පත්‍ර 03ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් භාවිතා කරනු ලබයි. එකී ආකෘති පත්‍ර 03 මගින් ඉදිරිපත් කරන සියලු තොරතුරු එක් ආකෘති පත්‍රයක් මගින් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන අතර එමගින් සමාගම් සංස්ථාපනය තව දුරටත් සරල කර එමගින් ව්‍යාපාර පහසු කිරීමේ දර්ශකයේ ඉහළ තලයකට ගෙන ඒම අපගේ ඉලක්කයයි.

- **Name Approval Simplification**

  නාමය අනුමත කිරීම සඳහා ඉල්ලීමක් ලැබුණු පසු එය මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මට්ටම් දෙකකින් පරික්ෂා කිරීමෙන් අනතුරුව අනුමැතිය ලබාදීම සිදු කරන අතර මෙම කටයුත්ත පද්ධතිය මගින්ම පරික්ෂා කර අනුමැතිය ලබාදීමේ ක්‍රමයක් අනුගමනය කිරීම ද අප ඉලක්ක කර තිබේ.

- **වරාය නගර සංවර්ධන කොමිසම වෙත ඇදී එන ආයෝජකයන් ආශ්‍රයෙන් අක් වෙරළ සමාගම් ලියාපදිංචි කර ගැනීම**

  වරාය නගර සංවර්ධන කොමිසම සමග සෘජුව කටයුතු කරමින් ඒ වෙත ඇදී එන ආයෝජකයන් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කිරීමට ද අපේක්ෂා කරනු ලැබේ. ඒ සඳහා අවශ්‍ය පරිදි අපගේ පද්ධතිය සංවර්ධනය කර ආයෝජකයන්ට වරාය නගර සංවර්ධන කොමිසම හරහා සෘජුවම අපගේ පද්ධතිය තුළ අක්වෙරළ සමාගම් ලෙස ලියාපදිංචි වීමට අවස්ථාව සැලසීම මෙහි අරමුණයි.

- **ජාතික හැඳුනුම්පත තහවුරු කර ගැනීමේ ක්‍රියාවලිය හඳුන්වා දීම**

  e–RoC පද්ධතියට තොරතුරු ඇතුලත් කරන සමාගම්වල අධ්‍යක්ෂකවරුන්, ලේකම්වරුන් සහ කොටස් හිමියන් එම පද්ධතියට ඇතුලත් කරන ජාතික හැඳුනුම්පත් අංකය නිවැරදි

අංකයක් ද යන්නත් ලබාදෙන තොරතුරු නිවැරදිද යන්නත් එසැණින් පරීක්ෂා කිරීම සඳහා පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධ වී කටයුතු කිරීමට ද අපගේ ඉලක්කයකි.

❖ **දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වැඩි කර ගැනීම හා පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම**

මෙම දෙපාර්තමේන්තුවට අවසාන වශයෙන් සම්පූර්ණ කාර්ය මණ්ඩලය වැඩිකර අනුමත කර ඇත්තේ 2016 වර්ෂයේදීය. 2016 (86,309) පැවති ක්‍රියාකාරී සමාගම් ප්‍රමාණයට මෙන් දෙගුණයකට ආසන්න ක්‍රියාකාරී සමාගම් ප්‍රමාණයක් 2022.12.31 (166,563) දින වන විට පවතින අතර ඒ අනුව ඊට සාපේක්ෂව දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය වැඩි වී ඇත. නමුත් ඒ හා සාපේක්ෂව කාර්ය මණ්ඩලය වැඩි වී නැත. විශේෂයෙන් මාණ්ඩලික නිලධාරීන් කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය වේ. එබැවින් ඉදිරි වසර තුළදී කාර්ය මණ්ඩලය වැඩිකර ගැනීම ඉලක්ක කරන අතර පවතින පුරප්පාඩු ද සම්පූර්ණ කරගෙන ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයකින් යුක්තව ඉදිරි කාර්යයන්ට මුහුණ දීම අපගේ ඉලක්කයකි.

❖ **අවසාන ආයෝජකයින් හට ආකර්ශනීය සේවාවක් ලබා දී ඉහළ වෙළඳ ප්‍රජාවක් බිහිකර එමඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමත්**

යන ඉලක්ක වෙත ලහාවීමේදී අප ආයතනය හමුවේ ඇති අභියෝග ජයගෙන ඉදිරි වර්ෂයට මුහුණදීම අපගේ සැලැස්මයි.

සංජීව දිසානායක

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400 ඩී ආර් විජේවර්ධන මාවත,
කොළඹ 10.

2007 අංක 7 දරණ සමාගම් පනතේ විධිවිධාන යටතේ පිණිටුවන ලද සමාගම් අරමුදල

2022.12.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2022.12.31	2021.12.31
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන විෂයයන්	10	25,290,038	51,585,296
ලැබිය යුතු ආදායම්	11	7,110,404	5,540,329
ලිපිද්‍රව්‍ය තොගය	12	2,913,882	3,177,551
ඉදිරියට කල ගෙවීම්	13	986,298	598,023
ආරක්ෂක සේවා ඇප තැන්පත්		25,000	25,000
ආයෝජන -භාණ්ඩාගාර බිල්පත්	14	59,999,941	
ලැබිය යුතු භාණ්ඩාගාර බැදුම්කර පොළිය	15	49,624,987	13,053,600
ලැබිය යුතු භාණ්ඩාගාර බිල්පත් පොළිය	16	5,887,895	
හා.නි.ලේ. ගෙන් හිලව් කල යුතු මුදල	17	975,729	654,116
		152,814,172	74,633,914
ජංගම නොවන වත්කම්			
කොටස් ආයෝජන		90,275,000	90,275,000
දේපළ පිරියත හා උපකරණ	18	1,097,729,499	326,850,542
කෙරිගෙන යන වැඩ ගිණුම	19	64,488,381	233,467,318
හා.නි.ලේ. අත්තිකාරම්	20	4,771,729,297	4,899,899,962
ආයෝජන -භාණ්ඩාගාර බැදුම්කර	21	1,927,103,803	1,283,266,000
ආයෝජන -භාණ්ඩාගාර බැදුම්කර (ඇවර)	22	68,665,551	43,666,289
		8,019,991,531	6,877,425,112
මුළු වත්කම්		8,172,805,703	6,952,059,026
වගකීම්			
ජංගම වගකීම්			
හා.නි.ලේ. ගෙවිය යුතු මුදල්	23	1,951,467	1,311,373
දේ.ආ.කො. ගෙවිය යුතු වැට්	24	889,556	320,136
ගෙවිය යුතු පොළිය - ඇවර කිරීම්	25	24,747,782	17,900,857
උපචිත වියදම්	26	8,372,826	16,618,295
පොදු තැන්පත් ගිණුම්	27	69,745	3,538,834
ඇවරකරුවන්ගේ තැන්පතු	28	50,351,526	29,989,953
		86,382,902	69,679,448
ජංගම නොවන වගකීම්			
මුළු වගකීම්		86,382,902	69,679,448
ශුද්ධ වත්කම්		8,086,422,801	6,882,379,578
ශුද්ධ වත්කම්/ස්කන්ධය			
සමුච්චිත අතිරික්තය / ඌනතාවය	29	8,086,422,801	6,882,379,578
මුළු ශුද්ධ වත්කම්/ස්කන්ධය		8,086,422,801	6,882,379,578

බී.ඒ.ආර්.එන්.බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී

බී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400,ඩී,ආර්,විජේවර්ධන මාවත,
කොළඹ 10

2007 අංක 07 දරණ සමාගම් පනතේ 479 (5) වගන්තිය අනුව මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුවේ. මෙම මූල්‍ය ප්‍රකාශනය 2024:02:29 දින අනුමත කරන ලදී.

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්,
කර්මාන්ත අමාත්‍යාංශය

ජේ.එම්. තිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ශ්‍රී ජය. කොළඹ 03.

සමාගම් අරමුදල - **2022.12.31** දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

		2022	2021	2020
		රු.	රු	රු.
අයභාරය	සටහන්			
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ ලැබීම්	1	512,656,180.06	478,671,525.39	448,266,309.25
වෙනත් අයභාර		207,057,026.38	70,974,635.20	183,300,141.26
භාණ්ඩාගාර බැඳුම්කර පොළිය	2	186,520,882.54	58,931,580.68	163,734,043.86
භාණ්ඩාගාර බිල්පත් පොළිය	3	8,287,904.77	344,278.52	8,327,397.40
ගොඩනැඟිලි කුලිය	4	12,120,000.00	11,160,000.00	11,160,000.00
ආපනශාලා කුලිය			-	2,000.00
වෙනත් ආදායම්	5	128,239.08	538,776.00	76,700.00
මුළු අයභාරය		**719,713,206.44**	**549,646,160.59**	**631,566,450.51**
වියදම්				
වැටුප්, වේතන සහ සේවක ප්‍රතිලාභ	6	(8,709,395.78)	(6,736,719.92)	(6,790,224.05)
සැපයුම් සහ පරිභෝජන ද්‍රව්‍ය	7	(119,431,217.30)	(114,190,576.29)	(89,123,510.57)
ක්ෂය	8	(10,089,685.16)	(10,220,278.38)	(10,987,355.95)
වෙනත් වියදම්	9	(1,486.98)	-	(600.00)
මුළු වියදම්		**(138,231,785.22)**	**(131,147,574.59)**	**(106,901,690.57)**
අතිරික්තය		**581,481,421.22**	**418,498,586.00**	**524,664,759.94**

2007 අංක 07 දරණ සමාගම් පනතේ විධි විධාන අනුව පිණිවුවන ලද සමාගම් අරමුදල

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් හා ගෙවීම් ලේඛණය

	රු.	රු.
මුදල් පොතේ ආරම්භක ශේෂයන්		
ගිණුම් අංක 143-100153298050 හි ශේෂය		47,360,774.86
ගිණුම් අංක 143-100113298052 හි ශේෂය		4,224,520.81
එකතු කළා- ලැබීම්		
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (මුදල්, චෙක්පත්)-143100153298050	30,873,847.00	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල- සම්පත් බැංකුව)	267,324,901.51	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (අන්තර්ජාල-නේෂන් ට්‍රස්ට් බැංකුව)	58,590,044.54	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (ලංකා බැංකුව)	503,592,607.67	
සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (සෘජු ලැබීම්)	19,440.00	
පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්ගේ ලැබීම් (වැට)	2,400.00	
හා.නි.ලේ. ගෙවීම් - අත්තිකාරම් හිලව් කිරීම	127,849,052.44	
මුදල් ඇණවුම් ආදායම් ලැබීම්	74,580.00	
ගොඩනැගිලි කුලිය	13,050,000.00	
ආවර කිරීමේ ගිණුමට ලැබීම්	20,580,073.09	
භාණ්ඩාගාර බැදුම්කරවලින් ලද පොළිය (සමාගම් ආවර කිරීමේ ගිණුම)	6,846,924.50	
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ලද මුදල (සමාගම් ආවර කිරීමේ ගිණුම)	-	
භාණ්ඩාගාර බැදුම්කරවලින් ලද පොළිය	173,803,377.50	
භාණ්ඩාගාර බිල්පත් කල්පිරීමෙන් ලද මුදල	42,400,000.00	
විවිධ තැන්පත්	66,175.00	
විවිධ ආදායම්	222,710.00	1,245,296,133.25
		1,296,881,428.92
අඩු කළා- ගෙවීම්		
අනිකාල හා නිවාඩු දින වැටුප්	3,900,071.68	
ගමන් වියදම් - දේශීය	194,792.00	
ලිපිද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා	4,164,992.62	
ඉන්ධන	4,158,942.94	
නිල ඇඳුම්	92,000.00	
වෛද්‍ය සැපයීම්		
වෙනත් (1205)	868,285.92	
වාහන නඩත්තු	919,329.86	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ(නඩත්තු)	5,972,875.10	
ගොඩනැගිලි (නඩත්තු)	465,396.67	
ප්‍රචාරණ	3,186,395.00	
තැපැල් හා සන්නිවේදන	13,312,009.50	
විදුලිය හා ජලය	11,204,668.31	
වරිපනම්	2,116,800.00	
වෙනත්(1409)	84,434,338.45	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ - වැඩිදියුණු කිරීම්	1,201,685.00	
වාහන වැඩිදියුණු කිරීම්	347,450.00	
ගෘහභාණ්ඩ හා කාර්යාලයීය උපකරණ	97,139.00	
යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ		
කාර්ය මණ්ඩල පුහුණු කිරීම්	342,778.33	
ප්‍රතිව්‍යුහගතකරණය	10,428,841.84	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10	9,505,025.67	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 SB	79,518,036.45	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 NTB	17,471,447.31	
හා.නි.ලේ. ගෙවීම්-ආදායම් ශීර්ෂ 20.03.02.10 BOC	149,487,505.28	
මුද්දර බදු	-	
බැංකු ගාස්තු	1,486.98	
එකතු කල අගය මත ගෙවීම් -දේශීය ආදායම් කොමසාරිස්	80,793,400.19	
එකතු කල අගය මත ගෙවීම් -දේශීය ආදායම් කොමසාරිස්	12,277,493.16	
භාණ්ඩාගාර බැදුම්කර ආයෝජන	746,320,008.71	
භාණ්ඩාගාර බැදුම්කර ආයෝජන (සමාගම් ආවර කිරීමේ ගිණුම)	24,999,261.13	
ආවර කිරීමේ ගිණුමෙන් ගෙවීම්	218,500.00	
ආදායමෙන් ආපසු ගෙවීම්	55,170.00	
තැන්පත් ආපසු ගෙවීම්	3,535,264.18	1,271,591,391.28
මුදල් පොතේ අවසාන ශේෂයන්		
ගිණුම් අංක 143-100153298050 හි ශේෂය	18,856,280.37	
ගිණුම් අංක 143-100113298052 හි ශේෂය	6,433,757.27	25,290,037.64
		1,296,881,428.92

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6		-
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	21,584,525.00	22,760,428.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3		
මුළු වත්කම්		21,584,525.00	22,760,428.00
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		21,584,525.00	22,760,428.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය			-
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4		-
අනුම ශේෂය	ඒසිඒ-3		
මුළු වගකීම්		21,584,525.00	22,760,428.00

පිටු අංක ...7... සිට ...51... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක ...52.... සිට ...59... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළදිරව කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුමකරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යාපාරකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචනය සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන ගණකාධිකාරි
නම : ජේ.එම්. නිලකා ජයසුන්දර	නම : සංජීව දිසානායක	නම : බී.ඒ. ආර්. එන්. බාලසූරිය
තනතුර : ලේකම්	තනතුර : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්	
දිනය : 2023.02.27	දිනය : 2023.02.24	දිනය : 2023.02.23

ජේ.එම්. නිලකා ජයසුන්දර
ලේකම්
කර්මාන්ත අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, ඩී.ආර්.විජේවර්ධන මාවත, කොළඹ 10.

බී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

සමාගම් අරමුදල

මුදල් ප්‍රවාහ ප්‍රකාශය (වක්‍ර ක්‍රමය)

2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	රුපි.	රුපි.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
ආදායම් වියදම් ගිණුමේ අතිරික්තය		581,481,421
ගැලපීම් :-		
ක්ෂයවීම්	10,089,685	
පොලී ආදායම	(194,808,787)	
පෙර වර්ෂයට කරන ලද ගැලපුම්		
ස්ථාවර වත්කම් විකිණීමේ ලාභ	(138,011)	
ස්ථාවර වත්කම් විකිණීමේ අලාභ	22,672	
		(184,834,441)
කාරක ප්‍රාග්ධනය වෙනස් වීම්		396,646,980
ඉදිරියට කල ගෙවීම්	(388,275)	
හා.නි.ලේ. ගෙන් හිලව් කල යුතු මුදල	(321,613)	
ලැබිය යුතු ආදායම්	(1,570,075)	
දේ.ආ.කොා. ගෙවිය යුතු වැට්	569,420	
උපචිත වියදම්	(8,245,469)	
පොදු තැන්පත්	(3,469,089)	
ලිපිද්‍රව්‍ය තොගය	263,669	
හා.නි.ලේ. ගෙවිය යුතු මුදල	640,094	(12,521,337)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		384,125,643
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය		
භාණ්ඩාගාර බැඳුම්කර කල් පිරීමෙන් ලද මුදල	42,400,000	
භාණ්ඩාගාර බැඳුම්කර/ බිල්පත්වල ආයෝජනය	(771,319,270)	
ස්ථාවර වත්කම් මිලදී ගැනීම්	(10,893,981)	
හා.නි.ලේ. අත්තිකාරම්	128,170,665	
ස්ථාවර වත්කම් විකිණීමෙන් ලැබීම්	209,810	
ඇවර කිරීමේ ගිණුමට ලැබීම්	20,580,073	
තැම්පත්කරුවන්ට ගෙවීම	(218,500)	
පොලී ලැබීම්	180,650,302	
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		(410,420,901)
මුදල් හා මුදල් සමාන වත්කම් වල ශුද්ධ වැඩි වීම		(26,295,258)
2022.01.01 දිනට මුදල් ශේෂය	51,585,296	
2022.12.31 දිනට මුදල් ශේෂය	25,290,038	
		(26,295,258)

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරි : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් වියදම් ශීර්ෂ අංකය : 297

පූර්ව මුදල් වර්ෂ 3 සඳහා ශුද්ධ ආදායම් රූපකිරීම	වර්ෂය 1	(2019)	රු. 226,853,316
	වර්ෂය 2	(2020)	රු. 894,462,000
	වර්ෂය 3	(2021)	රු.38,906,000

රු.

කාල පරිච්ඡේදය	ආදායම් සංකේතය	ආදායම් විස්තරය	වර්ෂ ආරම්භක ශේෂය (1)	වාර්තා කරනු ලබන වර්ෂයට අදාළ හිඟ මුදල් (2)	අයකර ගැනීම් (3)	කපා හරින ලද හිඟ ආදායම් (4)	වර්ෂ අවසාන ශේෂය 5=(1)+(2)-[(3)+(4)]
(1) වාර්තා කරනු ලබන වසරට අදාළ හිඟ මුදල්	2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු		228,192,000	33,140,000		195,052,000
උප එකතුව							195,052,000
(2) පසුගිය වසරට අදාළ හිඟ මුදල්							131,592,000
උප එකතුව							131,592,000
(3) පසුගිය වසරට පෙර වසර වන විට හිඟ මුදල්							803,100,000
උප එකතුව							803,100,000
එකතුව							1,129,744,000

2023.02.23
දිනය

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන
ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරි
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

.....
ආදායම් ගණන් දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන් දීමේ නිලධාරියාගේ නම: සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
ආදායම් ගණන් දීමේ නිලධාරියාගේ තනතුර: සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත
කොළඹ 10

වැඩසටහන් අනුව වියදම් මූල්‍යකරණ සාරාංශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සමාගම් රෙජිස්ට්‍රාර්
වියදම් ශීර්ෂ අංකය : 297

	මූල්‍යකරණය	වැඩසටහන 01*		වැඩසටහන 02*		මුළු එකතුව		
සංකේතය	සංකේත විස්තරය	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	ශුද්ධ ප්‍රතිපාදනය **	සත්‍ය වියදම	වියදමේ ප්‍රතිශතය ***
		1	2	3	4	5	6	(6÷5)X100
		රු.	රු.	රු.	රු.	රු.	රු.	%
11	දේශීය අරමුදල්	80,890,000	76,660,843			80,890,000	76,660,843	
12	විදේශ ණය							
13	විදේශ ප්‍රදාන							
14	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ණය							
15	ප්‍රතිපූර්ණය කරනු ලබන විදේශ ප්‍රදාන							
16	ප්‍රතිපාර්ශවීය අරමුදල්							
17	විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය							
18	විදේශීය මූල්‍යයනය ආශ්‍රිත දේශීය සම මූල්‍යනය							
21	විශේෂ නීති සේවා							
	එකතුව	80,890,000	76,660,843			80,890,000	76,660,843	

* ඒසීඒ- 2 (v) අනුව එක් එක් වැඩසටහන් යටතේ ඇති අගයන් ඇතුළත් කරන්න

** ඒසීඒ- 2 හි 4 වන තීරුවට යොමුගත ප්‍රතිපාදන

*** දශමස්ථාන රහිතව % සඳහන් කරන්න

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02 23

බී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, බී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

2022 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම් පිළිබඳ ප්‍රකාශය

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සමාගම් රෙජිස්ට්‍රාර්
වියදම් ශීර්ෂ අංකය : 297

රු.

අග්‍රිම ගිණුම් අංකය	2022 ජනවාරි 01 දිනට අග්‍රිම ශේෂය			අග්‍රිම ලැබීම්			අග්‍රිම පියවීම්			2022 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය			2022 දෙසැම්බර් 31 දිනට ආයතන පොත් අනුව ශේෂය	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
	1			2			3			4				
	නොපියවූ උප අග්‍රිම	නොපියවූ අග්‍රිම (නොපියවූ උප අග්‍රිම හැර)	එකතුව	භාණ්ඩාගාරයෙන්	වෙනත් මූලාශ්‍රවලින්	එකතුව	වියදම් මගින්	මුදල් මගින්	එකතුව	නොපියවූ උප අග්‍රිම ශේෂය	නොපියවූ අග්‍රිම ශේෂය	එකතුව	*5	6
	1(i)	1(ii)	1(iii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	3(i)	3(ii)	3(iii)=3(i)+3(ii)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=1(iii)+2(iii)-3(iii)	
7002-0-0-125-0-22-0					286,285,128	286,285,128	209,254,705	77,030,423	286,285,128				0	8,030,423

1. ඉහත 4 හා 6 ශේෂ අතර වෙනසට හේතු පෙන්වන්න

(1) ප්‍රේෂණය කරන ලද නමුත් භාණ්ඩාගාර පොත්වල නොපෙනෙන 2022.12.31 දිනට මුදල් ශේෂය	8,030,423
(2) වෙනත් හේතු -	.....
	8,030,423

මෙම ශේෂ වාර්තාව අත්සන් කරන දින වන විට පියවා ඇත්නම් ඒ බව ද, නොඑසේ නම් නොපියවීමට හේතු සඳහන් කරන්න.

ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02. 23

ඩී. ඒ. ආර්. එම්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

* මෙම ශේෂය මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයෙහි පෙන්විය යුතු ය.

2022 දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුම

වියදම් ශීර්ෂ අංකය : 297

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සමාගම් රෙජිස්ට්‍රාර්

රු.

අත්තිකාරම් ගිණුමේ නම	අත්තිකාරම් ගිණුම් අංකය	අත්තිකාරම් ගිණුම් සංඛ්‍යාව	2022 ජනවාරි 01 දිනට ශේෂය (1)	වියදමෙහි උපරිම සීමා රු. 7000000		ලැබීම්වල අවම සීමා රු. 5000000		හර ශේෂයන්ගේ උපරිම සීමා රු. 35000000.	බැරකම් පිළිබඳ උපරිම සීමා රු.	2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය
				වර්ෂය තුළ හර කිරීම් (2)		වර්ෂය තුළ බැර කිරීම් (3)		ශේෂය 4=(1)+(2)-(3)		
				මුදලින්	හරය් සටහන් මඟින්	මුදලින්	හරය් සටහන් මඟින්			
(1) රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම්	8493-0-0-297	1	22,760,428	6,382,221	1,976,285	6,886,140	2,648,269	21,584,525		21,584,525
(2) අනෙකුත් අත්තිකාරම්										
(3) විවිධ අත්තිකාරම්										

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02. 23

බී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, බී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

සටහන-(viii)

2015/10/23 දින නිකුත් කරන ලද භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ අංක 2015/03 හි උපදෙස්වලට අනුකූලව ආරම්භ කරන ලද බැංකු ගිණුම් පිළිබඳ 2022.12.31 දිනට තත්ත්ව වාර්තාව

වියදම් ශීර්ෂ අංකය: 297 අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම: සමාගම් රෙජිස්ට්‍රාර්

අනු අංකය	බැංකුවේ නම	ගිණුම් අංකය	2022.12.31 දිනට බැංකු ප්‍රකාශනය අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට මුදල් පොත අනුව ශේෂය (රු.)	2022.12.31 දිනට බැංකුවට ඉදිරිපත් නොකරන ලද චෙක්පත් එකතුව (මාස 6 ට වැඩි ඇතොත්)	අවසාන වරට බැංකු සැසඳුම් සකස් කළ මාසය
1	මහජන බැංකුව	143100199027300		0		2022 දෙසැම්බර්

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමි.

.....

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය : 2023.02 2 3

ජී. ඒ. ආර්. එස්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන පාර
කොළඹ - 10.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	තත්‍ය නැවත ගලපන ලද 2021 රු.	
-	ආදායම් ලැබීම්		157,198,963	170,514,939	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
275,000,000	බදු නොවන ආදායම් හා වෙනත්	4	157,198,963	170,514,939	
-	මුළු ආදායම් ලැබීම් (අ)		157,198,963	170,514,939	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		-	-	ඒසිඒ-3
-	තැන්පතු		55,644	64,700	ඒසිඒ-4
5,000,000	අත්තිකාරම් ගිණුම්		9,534,409	8,877,179	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		9,590,053	8,941,879	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		166,789,016	179,456,818	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		77,030,423	102,901,281	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		89,758,593	76,555,537	
	අඩු කළා : වියදම්				
-	පුනරාවර්තන වියදම්		-	-	
73,350,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	75,778,945	69,953,978	
-	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	-	-	ඒසිඒ-2(ii)
-	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	881,898	890,499	
950,000	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
-	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		76,660,843	70,844,477	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	-	-	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
-	හැකියා වර්ධනය	14	-	-	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
-	මුළු මූලධන වියදම් (උ)		-	-	
	තැන්පතු ගෙවීම්		55,644	64,700	ඒසිඒ-4
8,600,000	අත්තිකාරම් ගෙවීම්		8,358,506	7,551,254	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		8,414,150	7,615,954	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		85,074,993	78,460,431	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		4,683,600	(1,904,893)	
-	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		4,683,600	(1,904,893)	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			-	-	

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	කෘත්‍ය නැවත ඉදිපත් කළ 2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	157,198,963	170,514,939
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ ඵලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	4,866,837	4,268,940
අග්‍රිම ලැබීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	6,886,140	7,043,263
තැන්පතු ලැබීම්	55,644	64,700
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	169,007,584	181,891,842
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	75,778,945	69,953,977
සහනාධාර සහ මාරුකිරීම්	881,898	890,499
වෙනත් පුනරාවර්තන වියදම්(හා.නි.ලේ. අත්තිකාරම් හිලව් කිරීම්)	-	
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	8,878,453	530,131
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම්	77,030,423	102,901,281
අත්තිකාරම් ගෙවීම්	6,382,221	7,551,254
තැන්පතු ගෙවීම්	55,644	64,700
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	169,007,584	181,891,842
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
තිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	-	-
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ඉණුන් දීමේ නිලධාරී : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් | වියදම් ශීර්ෂ අංකය : 297

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම (4)			(5)
		මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම	වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21)	එකතුව	හිඟ ආදායම් රැස්කිරීම	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
		1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+4(ii)	5=2(iii)+(3)-4(iii)
2002.04.00	ලාභාංශ										
2002.05.00	රාජ්‍ය ව්‍යාපාරවල අතිරික්ත අරමුදල් මාරු කිරීම										
2003.01.00	දෙපාර්තමේන්තුමය විකිණීම්										
2003.02.00	පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම්										
2003.02.01	විභාගන ගාස්තු										
2003.02.02	ඉවත් නාවික ගාස්තු										
2003.02.03	1968 අංක 32 දරණ ප්‍ර.ලි.ප.කිරීමේ පනත යටතේ ගාස්තු										
2003.02.04	මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අදාළ ගාස්තු										
2003.02.05	රජයේ මුද්‍රණාලයේ ලැබීම්										
2003.02.06	වනසත්ව හා වෘක්ෂලතා සංරක්ෂණ ආඥා පනත යටතේ ගාස්තු										
2003.02.07	විසා බලපත්‍ර, විදේශ ගමන් බලපත්‍ර හා දිවිත්ව පුරවැසිභාවය ලබාගැනීම් සම්බන්ධ ගාස්තු										
2003.02.08	අපගමන බද්ද										
2003.02.09	තක්සේරු දෙපාර්තමේන්තුවේ ගාස්තු										
2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු	230000000	242000000	255982015		255982015		127,849,052			128,132,963
2003.02.11	සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් ලැබෙන තෙතික ගාස්තු										
2003.02.12	රාජ්‍ය කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු	45,000,000	45,000,000	29,066,000		29,066,000					29,066,000
2003.02.13	විභාග හා අනෙකුත් ගාස්තු										
2003.02.14	මෝටර් රථ ප්‍රවාහන පනත යටතේ අයකරනු ලබන ගාස්තු සහ අනෙකුත්										

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශය

ආදායම් ගණන් දීමේ නිලධාරී : සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්

වියදම් ශීර්ෂ අංකය : 297

ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව (1)		ආදායම් රැස්කිරීම (2)			(3)	ආදායමෙන් ආපසු ගෙවීම (4)			(5)
		මූලික ඇස්තමේන්තුව	සංශෝධිත ඇස්තමේන්තුව	අදාළ අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව විසින් රැස්කිරීම	වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු විසින් රැස්කිරීම (SA-21)	එකතුව	නිඟ ආදායම් රැස්කිරීම	මුදලින්	වැරදි නිවැරදි කිරීම	එකතුව	ශුද්ධ ආදායම
		1(i)	1(ii)	2(i)	2(ii)	2(iii)=2(i)+ 2(ii)	(3)	4(i)	4(ii)	4(iii)=4(i)+ 4(ii)	5=2(iii)+(3)- 4(iii)
2006	ප්‍රාග්ධන ආදායම්										
2006.01.00	පැවරීමෙන් ලත් මුදල්										
2006.02.00	ප්‍රාග්ධන වත්කම් විකිණීම										
2006.02.01	ඉහත										
2006.02.02	වෙනත්										
2006.04.00	ණය ආපසු අයකර ගැනීම										
3001.01.00	විදේශීය ප්‍රදානයන්	275,000,000	287,000,000	285,048,015	-	285,048,015	-	127,849,052	-	-	157,198,963
	අනෙකුත් ප්‍රභවයන්ගෙන් ලද ආදායම (අ)	275,000,000	287,000,000	285,048,015	-	285,048,015	-	127,849,052	-	-	157,198,963
	මුළු මිදූ නොවන ආදායම (අ) + (ආ)	275,000,000	287,000,000	285,048,015	-	285,048,015	-	127,849,052	-	-	157,198,963
	මුළු ආදායම (සටහන් 1 - 4)										

දිනය 2023.02.27

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී /මුදල් අංශයේ ප්‍රධානි නම සහ අත්සන

ඩී. ඒ. ආර්. එන්. බාලසූරිය
ප්‍රධාන ගණකාධිකාරී
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක: 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

ආදායම් ගණන් දීමේ නිලධාරී නම, තනතුර සහ අත්සන

සංජීව දිසානායක
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
"සමාගම් මැදුර"
අංක. 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ - 10.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් ශීර්ෂය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතය (%)
1003.07.08	සමාගම් ලියාපදිංචි කිරීමේ බද්ද	-	-	-	
2003.02.10	සමාගම් රෙජිස්ට්‍රාර්ගේ ගාස්තු	230,000,000	242,000,000	255,982,014.71	105.77
2003.02.12	රාජ්‍ය පොදු කොන්ත්‍රාත් පනත යටතේ අයකරනු ලබන ගාස්තු	45,000,000	45,000,000	29,066,000.00	64.59

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ශීර්ෂය 297

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	72,500,000.00	80,690,000.00	76,660,844.21	95
ප්‍රාග්ධන				

සමාගම් අරමුදල

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්ෂ වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	127,310,800.00	151,390,800.00	134,990,898.05	89
ප්‍රාග්ධන	19,400,000.00	20,400,000.00	12,417,894.17	61

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % වලින්
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
	නැත	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151 9152 9153 9154 9155 9160 9180	ගොඩනැඟිලි හා ව්‍යුහයන් යන්ත්‍රෝපකරණ ඉඩම් අස්පෘශ්‍ය වත්කම් ජීව විද්‍යාත්මක වත්කම් කෙරීගෙන යන වැඩ බදු දෙන ලද වත්කම්	නැත			

- ස්ථාවර වත්කම් CIGA S ගිණුම් ක්‍රමය යටතේ ගිණුම් තැබීමක් සිදු නොවේ. මෙය සමාගම් අරමුදල යටතේ ගිණුම් තබනු ලබයි.

04. කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධනය

විශේෂිත දර්ශක	භෞතික ලියාපදිංචියේ වර්ධනය ප්‍රතිශතයක් ලෙස		
	2021	2022	වර්ධනය ප්‍රතිශතයක් ලෙස
සමාගම් සංස්ථාපනය	18,434	17819	-3.45
සමාගම් ලේකම් ලියාපදිංචිය	779	1026	24
සමාගම් විගණකවරු ලියාපදිංචිය	359	388	7.47
පොදු කොන්ත්‍රාත් ලියාපදිංචිය	22,445	13216	-69.83
සෘණහාර ලියාපදිංචිය	15,535	20010	22.36

2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ වර්ෂ අනුව සමාගම් ලියාපදිංචිය

සමාගම් වර්ගය	2015	2016	2017	2018	2019	2020	2021	2022
සී/ස පෞද්ගලික සමාගම්	7,526	8,003	9,413	11,123	11,034	13,350	18,066	17,403
සී/ස පොදු සමාගම්	57	57	61	43	51	48	39	37
ඇපයෙන් සීමිත සමාගම්	113	48	43	160	71	56	125	238
සංගම්	30	140	148	59	177	152	183	126
විදේශීය සමාගම්	35	41	42	41	30	13	20	15
අක්වෙරළ සමාගම්	1	0	0	0	0	0	0	0
පොදු ලැයිස්තුගත සමාගම්	4	2	1	0	0	0	0	0
සීමා රහිත සමාගම්	-	-	-	-	-	-	01	0
නව ලියාපදිංචි සමාගම්	7,766	8,291	9,708	11,426	11,363	13,619	18,434	17819
මුළු ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව	55,053	63,344	73,052	84,478	95,841	109,460	127,894	145,713
නැවත ලියාපදිංචි සමාගම්	5	3	2	3	3	0	0	0
මුළු නැවත ලියාපදිංචි සමාගම්	25,066	25,069	25,071	25,074	25,077	25,077	25,077	25,077
මුළු එකතුව	**80,110**	**88,404**	**98,123**	**109,552**	**120,918**	**134,537**	**152,971**	**170,790**
නාමය කපා හරින ලද සමාගම් සංඛ්‍යාව	342	214	388	473	485	266	255	265
නාමය කපා හරින ලද මුළු සමාගම් සංඛ්‍යාව	1,881	2,095	2,483	2,956	3,441	3,707	3,962	4227
ක්‍රියාකාරී මුළු සමාගම් සංඛ්‍යාව	**78,229**	**86,309**	**95,640**	**106,596**	**117,477**	**130,830**	**149,009**	**166,563**

05. තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය (සියයට)		
			0-49	50-74	75-100
01දිළිඳුකම තුරන් කිරීම සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම.	ලියාපදිංචි සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම	සමිති ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය* (සමිති 22ක් ලියාපදිංචි කර ඇත.)	-	-	-
02.තිරසර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිතාවයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියළු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.	01 ලියාපදිංචි කරන සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම 02ලියාපදිංචි කරන පොදු කොන්ත්‍රාත් සංඛ්‍යාව වැඩි කිරීම	සමාගම් ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය* (නව සමාගම් 17819ක් ලියාපදිංචි කර ඇත.) පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීමේ වර්ධන ප්‍රතිශතය**	- -	- -	- -

* පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් වී ඇති සමාගම් සහ සමිති ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම් ප්‍රමාණය 2021 වර්ෂයට සාපේක්ෂව අඩු වී ඇත.

** පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීම්ද 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී අඩු වී ඇත. එයට ආසන්නම හේතුව ලෙස පැවති ආර්ථික අර්බුදය හා රජයේ වියදම් පාලනය කිරීම සඳහා නිකුත් කරන ලද ජාතික අයවැය චක්‍රලේඛ 03/2022 මගින් ව්‍යාපෘති හා ප්‍රසම්පාදන කටයුතු තාවකාලිකව නැවැත්වීම හඳුනාගත හැක.

5.2 <u>තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග</u>

<u>තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක</u>

එක්සත් ජාතීන්ගේ 70 වන මහා සමුළුවේදී එළිදක්වන ලද අරමුණු 17 අතරින් අප දෙපාර්තමේන්තුව වෙත අදාලවන අරමුණු 02 ක් හඳුනාගෙන ඇත.

01. **දිළිඳුකම තුරන් කිරීම සෑම අතින්ම පවතින කුසගින්න තුරන් කිරීම.**

මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන සමිති සංඛ්‍යාව වැඩි කර ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම ඉලක්ක කරගෙන කටයුතු කිරීම මගින් මෙම අරමුණ ඉටු කරගැනීමේ හැකියාව ඇත. අඩු ආදායම්ලාභීන් හා ග්‍රාමීය ජනයාගේ ආර්ථික තත්ත්වය ශක්තිමත් කිරීමත්, ජීවන තත්ත්වය උසස් කිරීමත් අරමුණු කරගත් බොහෝ සමිති සමාගම් බිහි වී ඇත. මෙම සමිති ලියාපදිංචි කිරීම මගින් ඒවාට නෛතික තත්ත්වයක් ලැබෙන අතර ඒවා නියාමනය කිරීම ද පහසු වේ. එමගින් එම සමිති සමාගම් වලට අදාල ජනකොටස් වෙත එහි ප්‍රතිලාභ ලැබෙන බවට තහවුරු කරගත හැක. ඒ අනුව ප්‍රබෝධා සංවර්ධන සමිති, මිතුරු සංවර්ධන සමිති, ග්‍රාම ශක්ති වැනි ස්වයංරැකියා ප්‍රවර්ධනය හා ණය දීමේ සමිති ලියාපදිංචිය වැඩි කිරීම සහ ග්‍රාමීය ආර්ථික ප්‍රවර්ධනයට ඉඩකඩ සැලසීම තුළින් දිළිඳුකම තුරන් කිරීමට දායකත්වයක් දිය හැක. පැවති ආර්ථික අර්බුදය යටතේ වුවද මෙම වර්ෂයේ සමිති 22ක් ලියාපදිංචි කර ඇත.

02. තිරසර පරිපූර්ණ ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම පූර්ණ හා ඵලදායිතාවයෙන් යුත් සේවා නියුක්තිය සුරක්ෂිත කිරීම. සියළු දෙනාටම වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීම.

වෙළඳ ප්‍රජාව ඉලක්ක කර ගෙන සමාගම් සංස්ථාපනයට හා පවත්වාගෙන යාමට අදාල සේවාවන් වෙත ප්‍රවේශවීමේ අවස්ථාවන්, හැකියාවන් හා පහසුකම් ප්‍රවර්ධනය කිරීමෙන් මෙම අරමුණ ඉටුකර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ලියාපදිංචි කරන සමාගම් සංඛ්‍යාව වැඩි කිරීම එනම් සමාගම්, සංවිධාන, පොදු කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම වැඩි කර ව්‍යාපාර ක්ෂේත්‍රය පුළුල් කිරීමටත් එමගින් ආර්ථික වර්ධනය සුරක්ෂිත කිරීම හා වැදගත් රැකියාවක් කිරීමට ඇති අයිතිය සුරක්ෂිත කිරීමට අවස්ථාව පුළුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

ජයග්‍රහණ

- පවතින ආර්ථික අර්බුදය හා ප්‍රවාහන අපහසුතා හමුවේ සේවාලාභීන්ද අපහසුතාවයට ලක් වී සිටි මෙම කාලසීමාවේ ඔවුන්ට අප දෙපාර්තමේන්තුවෙන් ලබා දෙන සියලුම සේවාවන් අප දෙපාර්තමේන්තුවට නොපැමිණ තමන් සිටින ප්‍රදේශයේම සිටම සිදුකර ගැනීමට හැකිය. මෙමගින් ඔවුන්ගේ කාලය හා මුදල් ඉතිරි කර ව්‍යාපාර කටයුතු පහසු කිරීමට අපට හැකි විය. මෙය අප දෙපාර්තමේන්තුව ලැබූ විශාල ජයග්‍රහණයකි.

- දිවයිනේ සෑම ප්‍රදේශයකම ජනතාවට තමන් පදිංචි ප්‍රදේශයේම සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ සමිති ලියාපදිංචි කිරීමට හැකිවී ඇති බැවින්දැඩි ආර්ථික අපහසුතා පැවති 2022 වසරෙහි ද සමිති 22ක් ලියාපදිංචි කිරීමට සමත් වී ඇති අතර එමගින් ඔවුන්ගේ කාලය, ශ්‍රමය ඉතිරි කිරීමට හැකිවීමත් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වයට තර්ජනයක් නොවී ඔවුන්ගේ සේවාවන් ඉටුකළ හැකිවීමත් අපගේ ජයග්‍රහණයකි.

- සේවා කටයුතු මාර්ගගත ක්‍රමය මගින් ලබාදීම හේතුවෙන් කඩදාසි මුක්ත වීමත්, කාලය හා ශ්‍රමය ඉතිරි වීමත්, කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය ඉහළ යාමත් සිදු වී ඇත.

අභියෝග

- සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව 2007 අංක 07 දරණ සමාගම් පනත, සමිති ආඥා පනත 123 වන අධිකාරිය, 1935 අංක 61 දරණ සීට්ටු ආඥා පනත, 1987 අංක 03 දරණ පොදු කොන්ත්‍රාත් පනත යන අණ පනත් මගින් පැවරී ඇති මූලික කාර්යයන් ඉටු කිරීම, නියාමනය හා මෙහෙයවීම සිදු කරනු ලබයි. එම කාර්යය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මෙන්ම සේවාලාභීන් වන දෙපාර්ශවය විසින්ම සිදුකළයුතු වන්නේ දැනටමත් ස්ථාපිත නීතිමය රාමුවක් තුළය. එබැවින් එම රාමුවෙන් පරිභාහිරව විකල්ප භාවිතා කරමින් කටයුතු කිරීමට හැකියාවක් නොමැත. උදාහරණ ලෙස පොදු කොන්ත්‍රාත් පනත යටතේ පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි කරනු ලබන්නේ මිලියන 05ට වැඩි කොන්ත්‍රාත් පමණි. ඒ අනුව මිලියන 05ට අඩු කොන්ත්‍රාත් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ නොහැක.

  එමෙන්ම එවැනි ලියාපදිංචි කිරීම් අපගේ සේවාලාභීන් විසින් මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන්නේ ඔවුන්ගේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළ ඔවුන්ට ව්‍යාපාරිකමය අවස්ථාවන් ලැබුණහොත්පමණි. එම අවස්ථාවන් කාලානුරූපීව

උච්චාවචනය වීම සාමාන්‍ය ස්වභාවයයි. නිදසුන් ලෙස 2022 වර්ෂය තුළ පැවති සමාජ ආර්ථික අර්බුද හේතුවෙන් දෙපාර්තමේන්තුව වෙත ලැබුණු ඉල්ලීම් ප්‍රමාණය අඩු වී ඇති බව නිරීක්ෂණය කළ හැකි අතර එය ය දෙපාර්තමේන්තුවේ පාලනයට යටත් නොවන හේතු නිසා සිදුවන්නකි. උදාහරණ ලෙස දෙපාර්තමේන්තුවේ සේවා සැපයීමේ ශක්‍යතාවය ප්‍රශස්ත මට්ටමක පවතින අවස්ථාවකදී වුවත් දෙපාර්තමේන්තුවේ සේවාදායකයින්ට ඔවුන්ගේ ව්‍යාපාරික පරිසරය තුළ මුහුණදීමට සිදුවූ කාලීන අභියෝගයන් හා අර්බුධ නිසා මෙම දෙපාර්තමේන්තුවෙන් සේවා ලබා ගන්නා අවස්ථා සංඛ්‍යාව හා එම අවස්ථාවන්ට අදාලව දෙපාර්තමේන්තුව විසින් කරනු ලබන ගාස්තු අයකිරීම් හේතුවෙන් ජනනනය වන ආදායම 2022 වර්ෂයේදී අඩු වී ඇති බව පෙනේ.

මෙම පසුබිම තුළ තිරසාර සංවර්ධන අරමුණු තුළ හඳුනාගෙන ඇති, ව්‍යාපාර පහසු කිරීමේලා දර්ශක වශයෙන් ගැනෙන නිර්ණය කර ඇති භෞතික ඉලක්කයන් සිය මෙහෙයවීමෙන් සපුරා ගැනීමටත් එම ඉලක්ක කරා ලගාවීම මෙම දෙපාර්තමේන්තුවට අපහසු කරුණක් වී ඇත.

මෙහිදී අවබෝධ කරගත යුතු වැදගත් කාරණයක් වන්නේ සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව මූලික වශයෙන්ම නීතිය නියාමනය කිරීම සඳහා ස්ථාපිත රාජ්‍ය ආයතනයක් වන බවයි. ඒ සඳහා විවිධ පනත් මගින් පනවා ඇති නීතිරීති අනුව මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන කාර්යභාරයන් සහ කර්තව්‍යයන් පූර්ණ වශයෙන්ම සංවර්ධන අභිමුඛ ඇගයීම් රාමුවක් තුළට අනුගත කිරීම අපහසුය.

- දිවයිනේ සෑම ප්‍රදේශයකම අන්තර්ජාල පහසුකම් නොමැතිවීම හේතුවෙන් මහජනතාවට මාර්ගගත ක්‍රමය යටතේ සේවා සපයාගැනීමේ අපහසුතා පවතී. මේ හේතුව නිසාම මාර්ගගත ක්‍රමය මගින් සමිති ලියාපදිංචි කිරීම අඩු අගයක් ගනී. නමුත් එවැනි අපහසුතාවන්ට ලක්වන සේවාදායකයන්ට කාර්යාලයට පැමිණ සේවා ලබාගැනීමට ඉඩකඩ සලසා ඇත.

06. මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	16	10	06
තෘතීයික	06	01	05
ද්විතීයික	110	98	28
ප්‍රාථමික	31	21	10

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපා ඇති ආකාරය

ආයෝජකයින් හට ආකර්ශණීය සේවාවක් ලබා දී ඉහළ ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකර එමඟින් රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමත් රාජ්‍ය ආදායම එකතු කිරීමේ වගකීමත් මෙම දෙපාර්තමේන්තුවට පැවරී ඇත. එම කාර්යය ඉටුකිරීමේදී දිනෙන් දින වර්ධනය වන පෞද්ගලික අංශයේ ව්‍යාපාර සඳහා සේවාවන් සැපයීමට අදාලව දෙපාර්තමේන්තුවේ කාර්යභාරයද දිනෙන් දින ඉහළ යයි. එසේ පුළුල් වන කාර්යභාරය කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ස්ථාවර කාර්ය මණ්ඩලයක අවශ්‍යතාවය පවතී. නමුත් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වැඩි සංඛ්‍යාවක් පැවතීම රාජකාරි කටයුතු සිදු කිරීමට දුෂ්කරතාවයක්ව හා බාධාවක්ව පවතී.

රටේ ආර්ථිකය ශක්තිමත් කිරීම උදෙසා සෘජු දායකත්වයක් ලබාදෙන මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පුරප්පාඩුවී පැවතීමෙන් ඵලදායී කාර්යක්ෂම සේවාවක් සේවා ලාභීන්ට ලබා දීම බාධා වේ. තවද ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය වන සමාගම් සංඛ්‍යාව ඉහළ නංවා ගැනීම අපේක්ෂිතව කටයුතු කරන මෙම දෙපාර්තමේන්තුව මගින් එසේ පිහිටුවන සමාගම් සඳහා අවශ්‍ය සේවාවන් හා උපදේශනයන් නිසිපරිදි ලබාදීමට නොහැකි වීමෙන් අපගේ වෑයම නිෂ්ඵල විය හැක. තවද කලට වේලාවට අවශ්‍යතා ඉටුකර දීමට නොහැකි වීමෙන් සේවාදායකයන් විශ්වාස භංගත්වයට පත්වීම සිදුවේ.

තවද කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු වැඩි වීමෙන් දැනට අනුයුක්ත කාර්ය මණ්ඩලයට ප්‍රමාණය ඉක්මවූ කාර්ය භාරයක් පැවරී ඇති අතර මෙම දෙපාර්තමේන්තුවේ රාජකාරී දිනෙන් දින වර්ධනය වීම හේතුවෙන් සිටින කාර්ය මණ්ඩලයේ කාර්යභාරය තව තවත් වැඩි වේ. එමගින් අපගේ කාර්ය මණ්ඩලය අසීමිත කාර්යබහුලත්වයට පත් වීම සිදු වෙනවා මෙන්ම ඇතැම්විට සිය

කටයුතු අප්‍රමාදීව සහ කාර්යක්ෂමව සිදු කර ගැනීමට නොහැකිව පීඩනයට පත්වන සේවාලාභීන්ගේ දෝෂ දර්ශනයට ලක්වීම මගින් තව තවත් පීඩනයට ලක් වේ.

මෙම කාර්ය ඉටුකිරීමත් සේවාදායකයන්ට ඉහළ ගුණාත්මක තත්ත්වයෙන් යුතු සේවාවක් සැපයීමත් අරමුණු කරගෙන මාර්ගගත ක්‍රමය ඔස්සේ සම්පූර්ණයෙන් සේවා සැපයීම සිදු කරනු ලබන අතර එම කටයුතු නියාමනය සඳහා පිහිටුවා ඇති තොරතුරු සන්නිවේදන හා තාක්ෂණ අංශය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ අධ්‍යක්ෂවරයකු, සහකාර අධ්‍යක්ෂවරයකු, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන් තිදෙනකු හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාරවරුන් 06 දෙනකු සහිත කාර්ය මණ්ඩලයක් අනුමත වී ඇත. නමුත් මෙම අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් 02ක් පමණක් සේවය කරනු ලබන අතර අනෙකුත් තනතුරු පුරප්පාඩු වී ඇත. මීට අමතරව 163ක් වන අනුමත කාර්ය මණ්ඩලයෙන් තනතුරු 49ක් පුරප්පාඩු වී පැවතීම දෙපාර්තමේන්තුවේ පරිපාලන කාර්යයන් සහ e–RoC ව්‍යාපෘතිය අඛණ්ඩව නිරවුල්ව පවත්වාගෙන යාමට බාධාවක් වී ඇති අතර එය අප මුහුණදෙන ප්‍රධාන අර්බුදයක් වී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
ආයතන සංග්‍රහය හා මූදල් රෙගුලාසි පිළිබඳ පුහුණු පාඨමාලාව	06	2022.01.27-2021.01.28	42,000/=	-	දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
මූලික විමර්ශනය පිළිබඳ පුහුණු පාඨමාලාව	03	2021.02.03	21,000/=	-	දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
නිවාඩු ලිපිකරුගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ පුහුණු පාඨමාලාව	02	2021.02.07-2021.02.08	17,000/=	-	දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
සේවාරම්භක පුහුණුව	05	2021.03.29- 2021.03.31	52,500/=		දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
ඩීසල් ජෙනරේටර් නඩත්තුව පිළිබඳ පුහුණුව	01	2021.12.22	10,000/=	-	දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.
ධනාත්මක චින්තනය හා ආතති කළමනාකරණය පිළිබඳ පුහුණුව	සියලුම කාර්ය මණ්ඩලය	2021.12.23	80,000/=	-	දේශීය	රාජකාරි ස්වභාවය අනුව දැනුම යොදා ගෙන ඇත.

දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය තමන්ගේ විෂය ක්ෂේත්‍රයට අදාලව පුහුණු කරමින් ඔවුන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමත් එමගින් ඔවුන්ගේ කාර්යක්ෂමතාවය වැඩිකිරීමත් අරමුණු කරගෙන නිලධාරීන් පුහුණු කිරීම සිදු කරනු ලැබේ. මීට අමතරව නිලධාරීන්ගේ ඉල්ලීම් මත ඔවුන්ට අවශ්‍ය පුහුණුවීම් ලබා දීමටත් කටයුතු කරනු ලැබේ. එමගින් දෙපාර්තමේන්තුවේ සෑම විෂයකටම අදාල ක්ෂේත්‍රයන් පිළිබඳ දැනුවත්භාවයෙන් යුතු ධනාත්මක ආකල්ප සහිත කාර්යක්ෂම කාර්යමණ්ඩලයක් පවත්වාගැනීමටත් එමගින් අපගේ සේවාදායකයන් වෙත කාර්යක්ෂම හා ඵලදායී සේවාවක් ලබා දීමටත් හැකි වී ඇත.

07. අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ.		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ.		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාළ නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ.		
1.6	වෙනත් - සමාගම් අරමුදල් ගිණුම	අනුකූල වේ.		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර	අනුකූල වේ.		

	පවත්වාගෙන යාම			
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මූ.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ.		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ.		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ.		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම්	අනුකූල වේ.		

	දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ.		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ.		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ.		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ.		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ.		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල්	අනුකූල වේ		

	කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම			
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ.		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ.		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ.		
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ.		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ.		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ.		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන	අනුකූල වේ.		

	දහනය නැවත පරීක්ෂා කිරීම			
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අදාළ නොවේ.		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ.		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම	අනුකූල වේ.		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ.		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ.		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අදාළ නොවේ.	සේවය අත්හැරයාම, ස්ථාන මාරු වී ගොස් සහ වැඩ තහනම් වී මාස 3ක් ඇතුළත ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම	

13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ.		
13.2	පොදු තැන්පත් සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ.		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ.		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ.		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ.		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ.		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ.		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ.		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ.		
16.3	20.09.2017 දිනැති MSD වක්‍රලේඛ අංක 04/2017	අනුකූල වේ.		

	ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාරතමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම			
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ.		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ.		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ.		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන	අනුකූල වේ.		

	මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම			
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ.		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ.		
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ.		

(6)

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීඒඕ/ඒ/ආර්ඔඕ/එෆ්එස්/22/34 මගෙ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2023 මැයි 31 දින

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
02 JUN 2023
ශ්‍රී ලංකා

අධ්‍යක්ෂ ජනරාල්,

රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත (සිංහල, ඉංග්‍රීසි, දෙමළ) මේ සමඟ එවා ඇත.

බී.ජී.අයි.නිරංජා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.

පිටපත: සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව

සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව
05 JUN 2023
ගිණුම් අංශය

අංක 306/72, පොළුවිල පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ටීඒසී/ඒ/ආර්ඕසී/එෆ්එස්/22/34 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 31 දින

සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව.

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 297 - සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1 (ආ)	ආදායම් ශීර්ෂයට අදාළ වර්ෂය තුළ රැස්කළ ආදායම ,මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ දැක්විය යුතුය.	1.6 (අ)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු ආදායමෙන් අර්ධයක් මගින්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් වෙත දී තිබූ ණය මුදල පියවා ගැනීමට ඉඩ දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ එසේ අඩුකරගත් රු.127,849,052 ක මුදල, මාසික ගිණුම් සාරාංශ තුළින් වාර්තා කිරීමේදී ආදායමෙන් ආපසු ගෙවීමක් ලෙස දැක්වීම හේතුවෙන් 20.03.02.10 දරන ආදායම් ශීර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) භාණ්ඩාගාර මුද්‍රිත අනුව අත්තිකාරම් ගෙවීම් රු.8,362,506 ක් වී තිබුණද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස රු.8,358,506 ක් දැක්වීම නිසා මූල්‍ය තත්ව ප්‍රකාශනයේ අත්තිකාරම් ගිණුම් ශේෂය රු.4,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 අංක 7 දරන සමාගම් පනතේ 131(1) සහ (2) වගන්ති ප්‍රකාරව ලියාපදිංචි සමාගම් වාර්ෂික වාර්තා භාර නොදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයට හිඟ හිටි ආදායම රු.3,389,232,000 ක් වී තිබූ අතර එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 13 කින් වර්ධනයක් වී තිබුණි. මින් 1/3 කොටසක් වන රු.1,129,744 ක් ඒකාබද්ධ අරමුදලට හිඟ වී තිබුණි.

(ආ) 1891 අංක 16 දරන සමිති ආඥා පනතේ (123 වන අධිකාරිය) 8(1) (ඇ) වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ අවසානයට වාර්ෂික වාර්තා ගොනු කළ යුතු ක්‍රියාකාරී සමිති සංඛ්‍යාව 15,884 වුවද, ඉන් සමිති 60 ක් වාර්ෂික වාර්තා ගොනු කර රු.60,000 ක ආදායමක් රැස්කර තිබුණද එසේ නොකළ සමිතිවල ක්‍රියාකාරී තත්වය පරීක්ෂා කර ලැබිය යුතු ආදායම රැස් කිරීමට කටයුතු කර නොතිබුණි.

3. මානව සම්පත් කළමනාකරණය

3.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නියෝජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් තනතුරෙහි අනුමත නිලධාරීන් 7 කගෙන් 2022 දෙසැම්බර් 31 දිනට තිදෙනෙකුගේ පුරප්පාඩු තිබීම නිසා නිලධාරීන් තිදෙනෙකුගේ සෘජු අධීක්ෂණය දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි.

(ආ) තොරතුරු තාක්ෂණ අංශයට අනුමත නිලධාරීන් 11 න් අධ්‍යක්ෂ ද ඇතුළුව තනතුරු 8 ක් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවතුණි. e – ROC පරිගණක පද්ධතියේ ගිවිසුම පරිදි දෙවන නඩත්තු වසර වන විට පද්ධතිය පවත්වාගෙන යාමේ දැනුම සම්පූර්ණයෙන් හුවමාරුවී තිබිය යුතු වුවත් මෙම අංශයට අදාල පුරප්පාඩු පැවතීම හේතුවෙන් පද්ධතියේ ඉදිරි මෙහෙයුම් හා සංවර්ධන කටයුතු සඳහා මෙන්ම පද්ධතිය බිඳවැටීමකින් තොරව දෙපාර්තමේන්තු කටයුතු ප්‍රසස්ථ මට්ටමෙන් පවත්වාගෙන යෑමට අහිතකර බලපෑමක් විය හැකි බැව් නිරීක්ෂණය විය.

(ඇ) ද්විතීයික මට්ටමේ තනතුරක් වන සමාගම් පරීක්ෂක තනතුර සඳහා අනුමත තනතුරු 10 න්, තනතුරු 05 ක් 2022 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු වී පැවතුණි. මේ හේතුවෙන් 2007 අංක 7 දරන සමාගම් පනත උල්ලංඝනය කරන සමාගම් වලට එරෙහිව නඩු පැවරීම් මන්දගාමීවීම් මත ආදායම් අයකර ගැනීමේ ක්‍රියාවලියට අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය.

(ඇ) සහකාර සමාගම් රෙජිස්ට්‍රාර් (පාලන) තනතුරට ස්ථිර නිලධාරියෙකු ද, පරිපාලන නිලධාරියෙකුද වසරකට වැඩි කලක සිට පුරප්පාඩුව පැවතුණි.

ඩී.ජී.අයි.නිරංජා

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට.